**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.5 හා 1.6 ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.1.(ආ), 1.6.2.1(ඇ), 1.6.2.2(ආ), 2.5(ඇ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ අනුව පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, පහත සඳහන් පරිදි එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ශේෂය රු.මිලියන 2,841.67 ක් වී තිබුණත්, කාර්යාලයේ පොත් අනුව අග්‍රිම ශේෂය රු.මිලියන 4.18 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 2,837.49 ක වෙනසක් පැවතුණි. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව එම වෙනස අග්‍රිම ගැලැපුම් ගිණුමේ ගැලැපිය යුතුව තිබුණත්, එසේ සිදු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු වීම. | මේ වන විට ගැලපුම් ගිණුමක් පිළියෙල කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | ඉහත සඳහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ කේවල ශේෂ පරීක්ෂාකර වෙනසක් වේ නම් එම ශේෂයන් හඳුනාගන්නා තෙක් එම වටිනාකම් ජර්නල් සටහන් මඟින් ප්‍රධාන ලෙජර් ශේෂය සංශෝධනය කර නොතිබුණි. | වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ කේවල ශේෂ පරීක්ෂා කර වෙනසක් වේ නම් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේදී ගිණුම්ගත නොකළ වත්කම් විශාල ප්‍රමාණයක් ගිණුම්ගත කරන ලදී. තව ද මාරුවූ අයිතම් ද නිවැරදි කිරීම් කරන ලදී. තවදුරටත් වෙනස්කම් පවතින ශේෂයන් 2020 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා ඇත. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### 1.6.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව තැන්පත් ගිණුම් 05 ක තැන්පත් ලැබීම් එකතුව හා තැන්පත් ගෙවීම් එකතුව පිළිවෙලින් රු.461,329,627 ක් හා රු.306,566,379 ක් වී තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වටිනාකම් පිළිවෙලින් රු.418,861,724 ක් හා රු.284,490,968 ක් අඩුවෙන් පිළිවෙලින් රු.42,467,903 ක් හා රු.22,075,411 ක් වශයෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සැකැසීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකින් තැන්පතු ලැබීම් හා ගෙවීම් අඩුවෙන් දක්වා ඇත. |
| (ආ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අදාළ ආදායම් සංකේත වෙනුවෙන් එකතු කළ ආදායම් වෙනත් ලැබීම් ලෙස ගිණුම්ගත කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ රැස් කළ රු.161,167,234 ක ආදායමෙන් රු.18,013 ක් අඩුවෙන් රු.161,149,221 ක් වෙනත් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | ගිණුම සකස්කිරීමේදී ප්‍රමාද දෝෂයකින් සිදු වි ඇති බව දන්වා ඇත. |
| (ඇ) | වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉක්මවීම වළක්වා ගැනීම සඳහා ශීර්ෂයෙන් දැරිය යුතුවූ එකතුව රු.197,615 ක වියදම් ජර්නල් සටහන් මඟින් අවස්ථා 02 කදී වෙනත් වැය ශීර්ෂයන්හි වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිවත් සම්පූර්ණවත් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට ගණන්දීමේ නිලධාරීන් වගබලා ගත යුතු වීම. | පරිපාලන වියදමින් දැරීමට නියමිත ප්‍රමාණය අදාළ වැය විෂයන්ට මාරුකර ඇති බව දන්වා ඇත. |

## 1.6.2.2.මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ විගණනය කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පත් ගිණුම් ශේෂ එකතුව රු. 217,484,429 ක් වී තිබුණි. එම ශේෂ එකතුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2019 ජනවාරි 01 දිනට ශේෂ එකතුව ලෙස රු.134,370,756 ක් වැඩියෙන් රු.351,855,185 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | 2019 ආරම්භක ශේෂය ලෙස 2019 නොවැම්බර් 30 දිනට ශේෂය ප්‍රමාද දෝෂයකින් ගිණුමේ සඳහන්කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ජංගම නොවන වත්කම් කේත 12 ක් යටතේ ශේෂය ලෙස රු.976,293,611 ක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට එම කේත 12 ට අදාළ 2019 ජනවාරි 01 දිනට ශේෂය ලෙස රු.1,950,534,023 ක් දක්වා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයට හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.974,240,412 ක වෙනසක් අනාවරණය විය. මෙම වෙනස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | වෙනස්වීමට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතුවීම. | මූල්‍ය වත්කම් 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කර අවසන් වී නොතිබිණි. 2019 වර්ෂයේදී වත්කම් ගිණුම්ගත කිරීම් කළ බැවින් එම අගයන් ආරම්භක ශේෂ ලෙස ගිණුම් ගත වේ. එබැවින් ගිණුමේ 2018 දෙසැම්බර් 31 අවසන් අගයන් හා 2019 ජනවාරි 01 අගයන් වෙනස් අගයක් ගන්නා බව දන්වා ඇත. |
| (ඇ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් යටතේ මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස රු.4,177,955 ක් දක්වා තිබුණි. එම සංඛ්‍යාවට අදාළ ඒ | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | - |

සී ඒ 3 ආකෘතිය අනුව මුදල් ශේෂයක් නොපැවතුණි. න අතර එම ශේෂයේ රු.3,277,077 ක නිරවුල් නොකර මැතිවරණ අත්තිකාරම් හා 2013 වර්ෂයේ සිට පියවා නොතිබුණු බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව තිබුණු රු.900,878 ක මුදලින් සමන්විතව තිබුණි. එම වටිනාකම් මූල්‍ය වත්කම් යටතේ ලැබිය යුතු අත්තිකාරම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

**1.6.2.3.මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී වෙනත් ලැබීම් ලෙස රු.161,167,234 ක් ලැබී තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු.18,013 ක් අඩුවෙන් රු.161,149,221 ක් ලෙස දක්වා තිබුණි. | වෙනස්වීමට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකින් ලැබීම්ශේෂ අඩුවෙන් දක්වා ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ලැබීම් රු.29,507,806 ක් හා තැන්පත් ලැබීම් රු.132,572,422 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය දැක්විය යුතුව තිබුණි. නමුත් එම වටිනාකම්වල එකතුව රු.162,080,228 ක් වී තිබුණත්, එය රු.18,013 ක් වැඩියෙන් | වෙනස්වීමට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකින් ලැබීම් ශේෂ අඩුවෙන් දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | රු.162,098,341 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ප්‍රවාහයන් ප්‍රධාන ලෙජර් ලැබීම් ලෙස දක්වා තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් හා තැන්පත් ගෙවීම් පිළිවෙලින් රු.39,937,278 ක් හා රු.306,566,379 ක් වශයෙන් එකතුව රු.346,503,657 ක් වී තිබුණි. අත්තිකාරම් ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහයේද, තැන්පත් ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් මුදල් ප්‍රවාහයේද, දැක්විය යුතුව තිබුණත්, එම මුළු වටිනාකමෙන් රු.312,339,673 ක් අඩුවෙන් ප්‍රධාන ලෙජර් ගෙවීම් යටතේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහයේ රු.39,932,278 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් පරිදි පිළියෙල කළ යුතුවීම . | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකින් තැන්පතු ගෙවීම් ශේෂ අඩුවෙන් දක්වා ඇත. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල ඒ සී ඒ -සී ආකෘතියේහි ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.332,179,777 ක් වූ ප්‍රධාන ලෙජර් වියදම සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.67,470,938 ක් අඩුවෙන් රු.264,728,839 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් පරිදි පිළියෙල කළ යුතුවීම . | 2019 වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුමෙන් පෙන්වා දුන් කරුණුවලට අනුව 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර ඇත. එම නිවැරදි කරන ලද අගයන් 2019 මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** හානි ලේඛනය | | |
| නුවරඑළිය හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා තිබුණු හානි හා පාඩු ලේඛන විගණිත දිනය වන 2020 පෙබරවාරි 10 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුවීම. | හානි පාඩු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කරන අතර මෙම හානි පාඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යාවත්කාලීනව සටහන් තබා ඇති බවත් අඹගමුව හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලද ලේඛන යාවත්කාලීන කරන ලද බවත් දන්වා ඇත. |
| **(ආ)** නිවාඩු ලේඛනය | | |
| නුවරඑළිය හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පොදු 190 ආකෘතියට අනුව නිවාඩු ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව නිවාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුවීම. | මේ පිළිබඳව අභ්‍යන්තර විගණන අංශයෙන් ද පෙන්වා දීමෙන් පසුවද මේ වන විට මෙම විෂයේ රාජකාරි යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බව දන්වා ඇත. |
| **(ඇ)** ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය | | |
| නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය පවත්වාගත යුතු වීම. | 2020 වර්ෂයේ සිට ලේඛනයක් නඩත්තු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම නිසා ඒවා සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රජා පාදක හරිත සමාජ "community based green clubs" ඇති කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 කට 2019 අගෝස්තු 27 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් 260-1-1-0-2509 වැය විෂයය සඳහා රු.4,050,000ක පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් ප්‍රතිපාදන ලබාදී තිබුණි. නමුත් එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණ අතර පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. | 260-1-1-0-2509 වැය විෂයය යටතේ රු.4,050,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අපගේ වැය ශීර්ෂය යටතේ වෙන්කර දී ඇති බව අගෝස්තු මස භාණ්ඩාගාර මාසික ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේදී අප විසින් හඳුනාගන්නා ලද අතර එම ප්‍රතිපාදනය සම්බන්ධව සොයා බැලීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කිරීමට හඳුනා ගන්නා ලද " Community base green clubs" ව්‍යාපෘතිය සඳහා වූ බව දන්වා ඇත. |
| (ආ) | ගම්පෙරලිය වැඩසටහන යටතේ රු.3,000,000 ක ප්‍රතිපාදන මත කර්කස්වර්ල්ඩ් පහළ කොටස පාලම ඉදිකිරීම ව්‍යාපෘතියේ අතැති බිල්පත් ලෙස කොන්ත්‍රාත්කරුගේ මුළු ලංසු මුදලම සඳහන් කර බිල්පත් සකස් කර තිබුණි. නමුත් මැනුම්පත් සමඟ අතැති බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් මිනුම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | බිල්පත් ඉදිරිපත් කිරීමේදී අනිවාර්යයෙන්ම මිනුම් පත් ඉදිරිපත් කළ යුතු වීම. | 2019 නොවැම්බර් 30 දින වන විට පාළමේ වැඩ කොටස් වලින් සියයට 90 කටත් වැඩි වැඩ ප්‍රමාණයක් නිමවී තිබීම හේතුවෙන් කළ යුතු සියළු වැඩ කොටස් වෙනුවෙන් බිල්පතක් සකස්කර අතැති බිල්පතක් ලෙස රඳවා ගැනීමට කටයුතු කරන ලදී.<br><br>විගණනයෙන් පෙන්වා දෙන ආකාරයට 2020 මාර්තු 06 දින වන විටත් සමහර වැඩ නිම නොවී පැවති බව පිළිගන්නා අතර මේ වනවිට සියළු වැඩ අවසන්ව ඇති බව දන්වා ඇත. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | | |
| | (i) | XII වැනි පරිච්ඡේදයේ 1.7 වගන්තිය | - | එක් එක් නිලධාරියා විසින් නිවාඩු ලේඛනයේ සටහන් කරනු ලබන නිවාඩු දින ඉදිරියේ බලය පැවරූ නිලධාරීයෙකු විසින් සිය අත්සන යොදා අනුමත කර නොතිබූ අවස්ථා 38ක් පැවතුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් විසින් නිවාඩු ලබා ගත්තද නිවාඩු අයදුම්පත කඩිනමින් අනුමත කරගෙන ලබා නොදීම නිසා මෙම අඩුපාඩුව සිදු වී ඇති බව දන්වා ඇත. |
| | (ii) | XLVII පරිච්ඡේදයේ 13.2 වගන්තිය | - | සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ නිලධාරීන් වග බලාගත යුතු වුවද, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලික විමර්ශන 05 ක කටයුතු මාස 03 ක සිට වර්ෂ 03 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | පරීක්ෂණවල නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබූ අවස්ථා මේ වන විට ක්‍රියාත්මක කර ඇති බවත් අනෙකුත් විමර්ශන ද කඩිනමින් සිදුකර අවසන් කරන බවත් දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | XIX පරිච්ඡේදයේ 3 වගන්තිය | - | රජයේ නිවාසවල මීට වසර 06 කට පෙර තක්සේරු කළ ආර්ථික කුලිය පදනම් කරගෙන එම නිවාසවල පදිංචි නිලධාරීන්ගේන් නිවාස කුලී අයකර තිබුණි. එම තක්සේරුව සංශෝධනය කිරීමට කටයුතු නොකර නිවාස කුලිය ලෙස නිලධාරීයාගේ වැටුපෙන් අයකර තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ වන විට ආර්ථික කුලී අය කරනු ලබන රජයේ පොදු සේවා නිවාසයන් වලට අදාළව නැවත වරක් ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා කැඳවීමටත් ඒ අනුව ආර්ථික කුලී සංශෝධනය කිරීමටත් පියවර ගන්නා බවත් දන්වා ඇත. |
| (iv) | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLIII පරිච්ඡේදයේ 24 වගන්තිය | - | විනය පරීක්ෂණයකින් තොරව නිලධාරීන් තිදෙනෙකු වෙත මුළු සේවා කාලය තුළ රජයේ නිවාසයක හිමිකම අහිමි කිරීමේ දඬුවම් ලබාදී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම නිලධාරීන්ට නිකුත් කළ ලිපිවල සඳහන් ආකාරයට එම නිලධාරීන් අසාධු ලේඛන ගත නොකළ බවත්, ඔවුන් තිදෙනා විසින් අභියාචනා ඉදිරිපත් කළ බවත්, ඒවායේ කරුණු සැලකිල්ලට ගෙන හා එම නිලධාරීන්ගේ එකඟතාවය ඇතිව නිවාස දෙකක් ආපසු භාර ගත් බවත් දන්වා ඇත. |
| (v) | XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | - | රජයේ නිවාසයක පාවිච්චි කළ ජලය හා විදුලිබලය සඳහා වූ ගාස්තු එහි පදිංචි නිලධාරීන් විසින් දැරිය යුතු වුවත්, නිලධාරීන් පදිංචි රජයේ නිවාස 07 ක ජල මීටර් හා විදුලි මීටර් සවි කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවාසවල පදිංචිකරුවන්ගෙන් මෙතෙක් ජල සහ විදුලි මීටර් වල අංක ලබා නොදුන් නිලධාරීන් හට එම තොරතුරු ලබා දෙන ලෙසට දන්වා ලිපි යොමු කර ඇති බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vi) | XIX පරිච්ඡේදයේ 6.4 වගන්තිය | - | යැපෙන්නන් නොවන පුද්ගලයින් රජයේ නිලධාරි නිවාසවල රඳවාගත් නිලධාරීන් තිදෙනෙකු වෙත පදිංචියෙන් ඉවත් වන ලෙස හා ඔවුන් අසාධු ලේඛනගත කරන බව දන්වා ලිපි යොමු කර තිබුණද, 2020 පෙබරවාරි 24 දින වන විටත් එම නිලධාරීන් පදිංචියෙන් ඉවත්කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන්ට නිකුත් කළ ලිපි වල සඳහන් ආකාරයට එම නිලධාරීන් අසාධු ලේඛන ගත නොකළ බවත්, ඔවුන් තිදෙනා විසින් අභියාචනා ඉදිරිපත් කළ බවත්, ඒවායේ කරුණු සැලකිල්ලට ගෙන හා එම නිලධාරීන්ගේ එකඟතාවය ඇතිව නිවාස දෙකක් ආපසු භාර ගත් බවත් දන්වා ඇත. |
| (vii) | XIX පරිච්ඡේදයේ 6.7 වගන්තිය | - | රජයේ නිවාසවල ජල ගාස්තු හා විදුලි ගාස්තු ගෙවීමේදී දැනට රජයේ නිවාසයේ පදිංචි නිලධාරීන්ගේ නමින් ලියාපදිංචි විය යුතුව තිබුණි. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිවාසවල වර්ෂ ගණනාවකට පෙර පදිංචිව සිට ඉවත් වූ නිලධාරීන්ගේ නමින් ජලය හා විදුලි බිල්පත් ගෙවා තිබුණි. නමුත් 2020 මැයි 01 දින වන විටත් එසේ කර තිබුණු ලියාපදිංචිය පසුව පදිංචි වූ නිලධාරීන්ගේ නමින් සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රජයේ නිවාසවල ජල හා විදුලි බිල්පත් මේ වන විට පදිංචිව සිටින නිලධාරීන්ගෙන් නමින් ලියාපදිංචි කර ගන්නා ලෙසට අදාළ නිලධාරීන් වෙත 2020 ජනවාරි 07 දින ලිඛිතව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (viii) | XIX පරිච්ඡේදයේ 3 හා 4.3.4 වගන්ති | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවාස කාණ්ඩ 06 යටතේ වෙන් වෙන්ව රජයේ නිවාසවල පදිංචිය සඳහා නිලධාරීන්ගේ නම් ඇතුලත් පොරොත්තු ලේඛන පවත්වා නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවාස ශ්‍රේණි සඳහා වෙන වෙනම පොරොත්තු ලේඛන සකස් කර ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. |
| (ix) | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLIII පරිච්ඡේදයේ 24 වගන්තිය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බලපත්‍ර නිකුත් කිරීමේ විෂය භාර නිලධාරියා විසින් ඉකුත් වර්ෂයේ රු.69,500 ක බලපත්‍ර ආදායම්වලට අදාළ තොරතුරු, පද්ධතියෙන් ඉවත් කර සිදු කර තිබූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූලික විමර්ශනය සිදුකර වාර්තාව ලබා දී ඇත. බලපත්‍ර වටිනාකම අදාළ නිලධාරියාගෙන් අයකිරීමට නිර්දේශකර ඇති බවත්. ඒ අනුව අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |
| (x) | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ රජයේ නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනයේ 14 වගන්තිය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු රාජකාරි අතපසු කිරීම/ ජනාධිපතිවරණ මැතිවරණ රාජකාරි පැහැර හැරීම හා නොදන්වා නිවාඩු ලබාගැනීම හේතුවෙන් 2019 නොවැම්බර් මාසයේ වැටුප් | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නියමිත දිනට ගම්පෙරළිය ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ හා මැතිවරණ පැවැත්වීමට අදාළ කටයුතු සංවිධානය කිරීමේ වගකීම පැවරී ඇති බැවින්, ඉහත තීරණයන් ගත් බවත් ආයතනයේ කටයුතු කාර්යක්ෂම හා විධිමත් කිරීමට ගත් තීරණයන් මිස ආයතන සංග්‍රහයේ විධිවිධාන හිතාමතා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ගෙවීම අත්හිටුවා තිබුණත්, ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් හෝ පවත්වා නොතිබුණි. | | අභිබවා කටයුතු කිරීමට ගත් තීරණයක් නොවන බව දන්වා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | | |
| | (i) මුදල් රෙගුලාසි 138(1) | 314, 875 | නුවරඑළිය හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 14 කදී සිදු කළ වියදම් නියමිත වැය විෂයට හර නොකර වෙනත් වැය විෂයයන්ට හර කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 260 වැය ශීර්ෂය යටතේ ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2019 වර්ෂයේ විවිධ වැඩසටහන් යටතේ සංවර්ධන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාග්ධන වැය විෂයන් යටතේ ලබා දුන් ප්‍රතිපාදන යටතේ දැරිය හැකි පරිපාලන වියදම්වලින් මෙම අත්‍යාවශ්‍ය වියදම් දරා ඇති බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 139 | 138,748 | අඹගමුව, කොත්මලේ හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 15 කදී වියදම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | කොත්මලේ-<br>---------------<br>ගමන් වියදම් ඉල්ලුම් කිරීමේදි ක්ෂේත්‍ර රාජකාරිය නිසිපරිදි ඉටු කළ බවට තහවුරුවක් ලබා දිය යුතු බව නිලධාරින් දැනුවත් කර ඇති බව දන්වා ඇත.<br><br>වලපනේ-<br>------------<br>වැය විස්තරය වවුචර්වල සඳහන් කරන ලෙස නිලධාරින් දැනුවත් කර ඇති බව දන්වා ඇත.<br><br>අඹගමුව-<br>------------<br>එම දිනවල පැවති කාර්යය බහුලත්වය හේතුවෙන් අදාළ වවුවරයෙන් එම සහභාගි වූ ලේඛනය නොතිබූ බව පිළිගෙන ඇත. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>--------------------------- | | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | - | බලය පැවරූ නිලධාරියෙකු විසින් බැහැරයාම සහ රාජකාරි නිවාඩු අනුමත කිරීමෙන් තොරව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් අවස්ථා 290 කදී බැහැරයෑම් සිදුකර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කාර්යාලයෙන් බැහැර වීමේදී විධිමත් අවසරයක් මත බැහැරයාම් අනුමත කරගෙන යා යුතු බවට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති අතර ඒ අනුව කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | 2016 පෙබරවාරි 11 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛ ලිපිය | - | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්අවස්ථා 55 කදී ප්‍රමාද වී පැමිණ තිබුණත් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඔවුන්ගේ නිවාඩුවලින් එම ප්‍රමාදයන් වෙනුවෙන් නිවාඩු අඩුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවාඩු විෂයේ රාජකාරි විධිමත්කර ඇති බවත් ප්‍රමාද වී පැමිණීම් සඳහා නිවාඩු ද සටහන්කර අවසන්කර ඇති බවත් දන්වා ඇත. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සංචිත වාහනයේ හා ප්‍රාදේශීය ලේකම් නිල රථයේ ඉන්ධන පරික්ෂාව පසුගිය කාලයේ රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් ප්‍රමාද වූ අතර එම කටයුතු අප්‍රමාදව සිදුකර විගණනයට වාර්තාකරන බව දන්වා ඇත. |
| (iv) | 2018 අගෝස්තු 21 දිනැති අංක 20/2018 දරන චක්‍රලේඛය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැටුප් නොලබන අභ්‍යාසලාභී නිලධාරීන් 4 දෙනෙකුට චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගෙන් උපදෙස් විමසීම් කර ඇත. ඒ සම්බන්ධව උපදෙස් ලැබෙන තුරු අභ්‍යාසලාභී උපාධිධාරී නිලධාරින්ට සංයුක්ත දීමනා ගෙවීම නවතා ඇති බව දන්වා ඇත. |
| (ඇ) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ<br>------------------------- | | | | |
| (i) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන | 158,692 | අදාල විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා නුවරඑළිය, වලපනේ හා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු නොකිරිම සම්බන්ධයෙන් අදාළ ග්‍රාම නිලධාරීන් වෙත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | චක්‍රලේඛය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් කාර්ය පිළිබඳ ග්‍රාම නිලධාරී අත්පොතෙහි 6.2 ඡේදය | | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන් විසින් විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ ලේඛනයේ සිදුවන වෙනස්වීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත දැනුම්දීම දින 07 කට වඩා ප්‍රමාද කිරීම නිසා අවස්ථා 08 කදී වැඩි පුර ගෙවා තිබුණු රු.158,692 ක්, 2020 පෙබරවාරි 10 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | | තරයේ අවවාද කොට ලිපියක් නිකුත් කර ඇති අතර, පොදු කොට්ඨාශ දිනයේ ග්‍රාම නිලධාරින් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට ද කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ii) | 2009 ජනවාරි 7 දිනැති අංක 01/2009 චක්‍රලේඛය | - | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආබාධිත විශ්‍රාම වැටුප් ලබන තිදෙනෙකුගේ පරීක්ෂණ වාර්තාවේ පිටපතක් හා වෛද්‍ය මණ්ඩල නිර්දේශ සහ නුවරඑළිය හා අඹගමුව ප්‍රාදේශීය කාර්යාලවල ආබාධිත විශ්‍රාමිකයන් 12 කට රැකවරණය සැලසෙන බවට ග්‍රාම නිලධාරී විසින් ලබාදෙන ත්‍රෛමාසික වාර්තා ලිපිගොනුවල ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එක් නිලධාරිනියක මඟින් පමණක් විශ්‍රාම ලිපිගොනු 2260ක කටයුතු සිදු කිරීම හේතුවෙන් කාර්යයන් අධික බැවින් මෙම කටයුතු අතපසු වී ඇති බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | 2011 ජුනි 14 දිනැති අංක විචැ/චක්‍රලේඛ/ 2011 දරන චක්‍රලේඛ ලිපි අංක 02 | 1,540,211 | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවස්ථා 08 කදී නොගෙවූ විශ්‍රාම වැටුප් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර කාල ප්‍රමාදයක් සහිතව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්තමානයේ එසේ කාල ප්‍රමාදයකින් තොරව යැවීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඉ) | ජාතික අයවැය චක්‍රලේඛය<br>------------------------<br>2016 නොවැම්බර් 24 දිනැති අංක BD/GPS/130/9/14/MC-v දරන චක්‍රලේඛය හා 2015 ජූලි 07 හා 2016 ජනවාරි 06 දිනැති අංකBD/GPS/130/9/14/MC-ii දරන ලිපි | 277,000 | යතුරුපැදිලාභි තනතුරක සිට විවිධ හේතුමත තනතුරු නොලැබීම මත අඹගමුව හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් 2019 මැයි හා සැප්තැම්බර් මාසවල දී අයකර ගන්නා ලද මුදල් 2020 පෙබරවාරි 25 වන දින විටත් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමෙන් අනතුරුව අදාළ ලිපිලේඛන පසුව ඉදිරිපත් කරන තෙක් අයකරගත් මුදල් අයවැය දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇති බව දන්වා ඇත. |

**1.6.6 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්**

------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 24 දරන උපයන විට ගෙවීමේ බදු පනත අනුව නිලධාරියෙකුට එක් වරක් පමණක් ගෙවන ප්‍රසාද දීමනා ආදිය සඳහා උපයන විට ගෙවිය යුතු බදු වගු අංක 02 (Tables) අනුව ගණන් බැලිය යුතුව තිබුණි. ගම්පෙරලිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩ සටහනට අදාළව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය හා ගෙවීම් නිර්දේශ කිරීම වෙනුවෙන් කාර්මික නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් වගු අංක 02 භාවිතා නොකර වගු අංක 01 පදනම් කරගෙන දීමනා නිලධාරීන්ට මාසිකව ඒකාකාරව ලැබෙන ලෙස සලකා ගණන් බලා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම දීමනාව සඳහා වගු අංක 01 යොදා ගැනීමට සිදු වූයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තු මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව වන අතර, එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 02 වන වගන්තියේ 1 වන ඡේදය මගින් වැටුප්, කොමිස් මුදල්, අතිකාල, ගමන් වියදම් දීමනා ගාස්තු, විශ්‍රාම වැටුප් ආදී සියල්ල මේ සඳහා යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති බවත්, තවදුරටත් මේ පිළිබඳ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විමසා පැහැදිලිකර ගැනීම් කරන බවත් දන්වා ඇත. |

### 1.6.7 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අනුමත නොකළ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සුරක්ෂිත මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඉදිරිපත් කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලද රු.1,692,000 ක ප්‍රතිපාදන 2019 මැයි 21 දින නුවරඑළිය සහ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් | ප්‍රතිපාදන ලබාදුන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් සංශෝධිත ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාගත යුතු වීම. | ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන ගෙන්වා ගැනීම සිදුකරන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සංශෝධන ඇස්තමේන්තුවලට සිදුකර ක්‍රියාත්මක කරන අතර අමාත්‍යාංශයෙන් වෙනම අනුමැතියක් අවශ්‍ය නොවන බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| කාර්යාලවලට ලබාදී තිබුණි. ව්‍යාපෘති කටයුතු භෞතිකව පරීක්ෂාවේදී යෝජිත ඇස්තමේන්තුගත කාර්යයන් වෙනුවට සංශෝධිත ඇස්තමේන්තු යටතේ අලුත්වැඩියා කටයුතු සිදුකර තිබුණි. සංශෝධිත ඇස්තමේන්තු සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |

**(ii) සහතික නොකළ ගනුදෙනු**

විධිමත් පරිදි සහතික කිරීමකින් තොරව පහත සඳහන් ගෙවීම් කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 138(4),(6) හා (8) අනුව වවුචර සහතික කිරීමට බලයලත් නිලධාරියෙකු විසින් සියලුම වවුචර සහතික කළ යුතු වුවද, නුවරඑළිය හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.6,006,137 ක් වූ වවුචර් 19 ක් සඳහා සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වවුචර්පත් සියල්ල සහතිකකරන ලද බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

අග්‍රිම කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ අතැති බිල් ගෙවීම් කිරීම සඳහා රු.620,029,700 ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණද, රු.190,863,000 ක අග්‍රිම පමණක් ලැබී තිබුණි. ඒ අනුව ඉල්ලුම් කළ අග්‍රිම හා සත්‍ය වශයෙන් ලැබුණු අග්‍රිම අතර වෙනස | කර්මාන්ත බිල් ගෙවීම් කිරීම සඳහා වසර අවසානය තෙක් ප්‍රමාද නොකර, ගිවිසුම්ගත පරිදි කර්මාන්තය නිම කර අවසන් වූ විට නොපමාව බිල්පත් ඉදිරිපත් කළ යුතු වීම. | එක් මසක ඉල්ලන ලද ප්‍රමාණය නොලැබූ විට එම මුදලට එකතු කර ඊළඟ මාසයට අග්‍රිම ඉල්ලුම් කිරීම සිදුවන බවත් වර්ෂ අවසානයේ අග්‍රිම නොලැබීම නිසා අතැති |

| | | |
|---|---|---|
| රු.429,166,700 ක් වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂ අවසානයේ වැඩ නිමවූ ව්‍යාපෘති 452 ක් වෙනුවෙන් රු.402,613,246 ක් අතැති බිල් සඳහා ගෙවීම් කළ යුතුව පැවතුණි. | | බිල්පත් විශාල ප්‍රමාණයක් ඉතිරි වූ බවත් දන්වා ඇත. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 260-1-1-0-2509 වැය විෂයයට අදාළව රු.4,050,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවීම සම්බන්ධයෙන් සාධාරණ හේතු ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ප්‍රමුඛ නොවන ව්‍යාපෘතීන් හා මෙතෙක් ආරම්භ කර නොමැති අයවැය යෝජනාවල අඩංගු ව්‍යාපෘති ඉදිරි වර්ෂය තෙක් කල් දැමීම හෝ නවතා දැමීම සඳහා ලබා දී ඇති උපදෙස්වලට අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකළ බව දන්වා ඇත. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව ගිණුමේ සටහන් අංක iii යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැරකමක් 2020 වර්ෂයේදී නිරවුල් නොකළ යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ රු.1,847,817 ක් වූ කිසිදු බැරකමක් භාණ්ඩාගාරය විසින් නිකුත් කරන බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ඇතුළත්ව නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කළ යුතු වීම. | සිගාස් වැඩසටහනේප්‍රතිපාදන ඉතිරිව තිබේනම් පමණක් බැරකම් ඇතුළත්කළ හැකි ය. නමුත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ඇති වූ බැරකම් ගිණුමේ දක්වා ඇති බව දන්වා ඇත. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වියදම් වාර්තා අනුව වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් මූලධන වැය විෂයයන් 15ක් යටතේ ලබා දී තිබුණු ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදන වලින් සියයට 15 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | සියළු වැඩසටහන් සිදු කිරීමට සැලැසුම් කර තිබුණ ද, මුදල් ප්‍රතිපාදන මේ සඳහා වෙන් නොවීම මත සිදුකළ නොහැකි වූ බව දන්වා ඇත. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලබා දී තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමකළ පසු දින 10 ක් ඇතුළත පියවිය යුතුව තිබුණත්, අවස්ථා 06 කදී එකතුව රු.58,150 ක අග්‍රිම දින 38 ක සිට දින 71 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර පියවා තිබුණි. | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වැඩසටහන් සිදු කරන සියලුම නිලධාරින්ට නියමිත දිනයේ දී අත්තිකාරම් පියවීමට කටයුතු කරන ලෙසට තරයේ උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. |
| (ආ) | නුවරඑළිය හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පළාත් සභාවට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂ එකතුව රු.788,403 ක් වී තිබුණි. එම ණය ශේෂය මාස 03 ක සිට මාස 12 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂය අයකර ගෙන නොතිබුණි. | ලබා දුන් ණය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී යන සියළු නිලධාරීන්ගේ ණය එකවර නොපියවන අතර මාසිකව අයකරන වාරිකය ප්‍රේෂණය කිරීම සිදු වන බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වර්ෂ 05 ක සිට පැවත එන රු.49,985 ක ණය ශේෂයක්ද, වැඩ තහනමට ලක් වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01 ක සිට වර්ෂ 05 දක්වා කාලයක සිට හිඟහිටව පැවැත එන රු.459,818 ක ණය ශේෂය ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ලබා දුන් ණය අත්තිකාරම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | වැඩ තහනම් වූ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ගෙවා අවසන් කරන ලෙස දන්වා යවා මුදලින් කොටසක් පියවා ඇති අතර ඉන්පසු ගෙවීම් කර නොමැති බැවින් නීත්‍යානුකූලව අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**2.6 තැන්පතු**

**----------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් 3 කට අදාළව එකතුව රු.5,358,120 ක් වූ තැන්පත් ශේෂ 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවිම. | ඉඩම් තැන්පතු වර්ෂ 10 ක් ඉක්මවා තිබුණ ද, ඉඩම් අමාත්‍යාංශය හා අනෙකුත් ආයතනයන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතුවලදී කාලය ගතවීම නිසා මෙම තත්වය ඇති වී ඇති බව දන්වා ඇත. |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මුදල්රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව, එක් එක් මාසය අවසන් වී එළඹෙන මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතුව තිබුණත්, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය බැංකු ගිණුම සඳහා 2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ 2020 මැයි 19 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිලධාරි හිගය හේතුවෙන් බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති බව පිළිගන්නා බවත්, මේ වන විට 2019 දෙසැම්බර් දක්වා වන බැංකු සැසඳුම් සකස් කර ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නුවරඑළිය හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක බැංකු සැසඳුම් ප්‍රකාශවල සඳහන් එකතුව රු.65,982 ක නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල්රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම්වල රු.29,437 ක මාස 06 ඉක්මවූ චෙක්පත් ඇතුළත් නොවන බවත්, කල් ඉකුත් වූ අනෙකුත් චෙක්පත් සම්බන්ධයෙන් මේ වන විට කටයුතුකර ඇති බවත් දන්වා ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

----------------------------------

**3.1.1** **ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

--------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් වනිතා සංවර්ධන ඒකකය මගින් වැන්දඹු කාන්තාවන්ගේ සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීම සඳහා නිවාස 25 ක් ඉදිකිරීමට හැකියාවක් පවතින ආයතන හඳුනා ගැනීමට සහ ව්‍යාපෘති එක් කිරීමට සැලැසුම් කර තිබුණත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව වැන්දඹු කාන්තාවන් 250 ක් උදෙසා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා කාන්තාවන් 50 ක් ස්වයං රැකියා සඳහා යොමු කිරීමට අපේක්ෂා කර තිබුණත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වීම. | සියළු වැඩසටහන් සිදුකිරීමට සැලැසුම් කර තිබුණ ද, මුදල් ප්‍රතිපාදන මේ සඳහා වෙන් නොවීම මත සිදු කළ නොහැකි වූ බව දන්වා ඇත. |
| (ආ) | වතුකර කාන්තාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැසිකිළි 25 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | අපේක්ෂිත සැලසුම් අනුව කාර්යභාරයන් ඉටු කළ යුතු වීම. | සියළු වැඩසටහන් සිදුකිරීමට සැලසුම් කර තිබුණ ද, මුදල් ප්‍රතිපාදන මේ සඳහා වෙන් නොවීම මත සිදුකළ නොහැකි වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | කාන්තා ව්‍යවසායිකාවන් වෙනුවෙන් දිස්ත්‍රික්කයේ එක් පොදු ස්ථානයක අලෙවි සංකීර්ණයක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණද, එය ඉටුකර නොතිබුණි. | අපේක්ෂිත සැලැසුම් අනුව කාර්යභාරයන් ඉටු කළ යුතු වීම. | මේ වන විට කාන්තාවන් සඳහා නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ අලෙවි සැලක් පවත්වාගෙන යනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | සංස්කෘතික අංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 ක් තුළ සංචාරක ආකර්ෂණීය ස්ථාන 25 ක් සුරක්ෂිත කිරීමට සහ පුරාවිද්‍යා ස්ථාන 10 ක් සුරක්ෂිත කිරීමට සැලැසුම් කර තිබුණද, වර්ෂය තුළ ඒ සම්බන්ධ කටයුතු කිරීම් පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ සඳහා අමාත්‍යාංශ මට්ටමින් මුදල් ලැබී නොමැති අතර මධ්‍යම සංස්කෘතික අරමුදල් යටතේ සිදුකරන කාර්යයක් බැවින් මෙම වසරේ මධ්‍යම සංස්කෘතික අරමුදල දැනුවත් කර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත බව දන්වා ඇත. |
| (ඈ) | පූර්ව ළමාවිය සංවර්ධන වැඩසටහන යටතේ පෙර පාසල්වල සෙල්ලම් මිදුල් 51 ක් සෑදීම ,පෙර පාසල් 21 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම, පෙර පාසල් 7 ක ආරක්ෂිත වැට ඉදිකිරීම, පෙර පාසල් 35 කට ඉගෙනුම් උපකරණ ලබාදීම, පෙර පාසල් 12 ක් සඳහා ඩෙස් පුටු ලබාදීම වැනි සැලැසුම් කළ අරමුණු වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරිපත් කිරීමට නියමිත කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් කර ඇති බවත් අඩුපාඩු සකස්කර සභාගත කිරීමට නියමිත බව දන්වා ඇත. |
| (ඉ) | පෝෂණ සංවර්ධන අවශ්‍යතා වැඩසටහන මගින් කොත්මලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අවු 1 ක සිට 5 ක් දක්වා ළමුන්ගේ පෝෂණ අවදානමෙන් මුදවා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරිපත් කිරීමට නියමිත කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත්කරන ලදී. අඩුපාඩු සකස්කර සභාගත කිරීමට නියමිත බව දන්වා ඇත. |

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>--------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------- |
|---|---|---|
| ගම්පෙරලිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2019 යටතේ 2019 ජනවාරි 01 දිනැති අංක MFMM/DFD/01/2019 | සංවර්ධන වැඩසටහනේ අරමුණුවලට අදාළව | පිළිතුරු ලබාදී නැත. |

| | |
|---|---|
| දරන ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 ඡේදය අනුව ව්‍යාපෘතිය මගින් තාවකාලික වහලක් ස්ථිර වහලක් බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කළ හැකි වුවද, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය මත ඉටුකළ රු.300,000 බැගින් වූ ව්‍යාපෘතියක් අරමුණුවලට පටහැනිව අලුතින්ම ඉදිකරමින් පැවති නිවසකට ලබාදී තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් ප්‍රතිපාදන මත කොත්මලේ ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ පූඩළුඔය නගරයේ සතිපොළ සකස් කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර එහි වැඩ නිම වී තිබුණි. එම ව්‍යාපෘතිය පරීක්ෂාවේදී පූඩළුඔය බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා අර්ධ වශයෙන් නිමකරන ලද ගොඩනැගිල්ලක් යොදා ගෙන සතිපොළ ඉදිකර තිබුණි. ගොඩනැගිල්ලේ වහල නිම කිරීමේදී තිරස්ව යොදන සී පර්ලින් දෙකක් අතර උපරිම පරතරය 1.5 m විය යුතුව තිබුණත් 2.15 m පරතරයකින් යුතුව සී පර්ලින් යොදා වහලය ඉංජිනේරු ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි. කොන්ක්‍රීට් කුළුණු මත සී පර්ලින් රැඳවීමට කටයුතු කර තිබුණද, කුළුණු මත සී පර්ලින් රැඳවීමට අපහසු ස්ථානවල එක් කම්බියකින් සී පර්ලින් | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | පූඩළුඔය නගරයේ සතිපොල සකස් කිරීම කොත්මලේ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි. විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව කොත්මලේ ප්‍රාදේශීය සභාව වෙත විගණන විමසුම යොමු කර ඇති අතර, නොපමාව පිළිතුරු ලබා දෙන ලෙස දැනුම් දී ඇත. අදාළ අඩුපාඩු සකසා ගැනීමට කටයුතු යොදන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | පාස්සා වහල සකස් කළ ස්ථාන පැවතුණි. | | |
| (ආ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ අධීක්ෂණය යටතේ රන්වන්තලාව ඉක්කාව ඇළ සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2020 පෙබරවාරි 26 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී ඉදිකර තිබූ ඇළ පැති බැම්මේ පළල අනුමත සැලැසුම අනුව 220 mm විය යුතු වුවද, එය 200mm සිට 220 mm දක්වා පරාසයක පැවතුණි. ඇළ මාර්ගයේ පිහිටි කලුගල් මතුපිට ඇළ පැති බැම්ම ඉදිකර තිබූ ස්ථාන පැවති අතර ඒවා නිසි ලෙස පොළවට සම්බන්ධ වී නොතිබුණි. සැලැසුම අනුව පැති බැම්මේ පොළොවෙන් මතුපිට කොටස 600 mm ලෙසත් පොළොව තුළ (foundation) කොටස 300 mm විය යුතු වුවද, පොළොවෙන් මතුපිට (Super Structure) කොටස 900 mm වූ ස්ථාන පැවතුණි. මෙම පැති බැම්ම පෙර පැවති පැති බැම්මේ පතුල ඉවත් කිරීමකින් තොරව ඒ මත ඉදිකර තිබුණි. ඉදිකර තිබූ බැම්මේ ස්ථාන කිහිපයක මී වද දෝෂ පැවතුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | රන්වන්තලාව ඉක්කාව ඇල සංවර්ධනය කිරීම නුවරඑළිය ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයවිසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් බවත් විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත විගණන විමසුම යොමු කර ඇති අතර, නොපමාව පිළිතුරු ලබා දෙන ලෙස දැනුම් දී ඇති බවත් රඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර අඩුපාඩු සකසා ගැනීමට කටයුතු යොදන බවත් දන්වා ඇත. |
| (ඇ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාවට නැංවූ වැවහින්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය පිළිබඳව 2020 පෙබරවාරි 26 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ස්ථාන තුනක් පුපුරා තිබුණි. මාර්ගය නැවත පිළිසකර කර දෙන | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | ව්‍යාපෘතිය නඩත්තු කාල සීමාව තුළ මාර්ගයේ ඉරිතැලීමක් දක්නට ඇති බවට සංවර්ධන නිලධාරී විසින් වාර්තා කිරීමෙන් පසු කාර්මික නිලධාරී උපදෙස් මත එය සකස් කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරු වෙත 2020 ජනවාරි 08 ලිඛිතව දැනුවත් කළ අතර ඒ අනුව මාර්ගය |

| | | | |
|---|---|---|---|
| | ලෙස 2020 ජනවාරි 08 දින කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුවත් කර තිබුණද, විගණිත දිනය වූ 2020 පෙබරවාරි 26 දින වන විටත් එය නැවත පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. | | ප්‍රතිසංස්කරණය කර ඇති බවත් නැවත සකස් කරන ලද කොටසේ පැවැත්ම තහවුරු කර ගැනීමෙන් පසු අත රැඳවුම් මුදල් නිදහස් කරන බවත් සඳහන් කර ඇත. |
| (ඇ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දුන් ප්‍රතිපාදන මත ගොවිජන සේවා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය විසින් අධීක්ෂණය කළ හෙල්බොඩවැවහින්න ඇළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2020 පෙබරවාරි 26 දින එම ව්‍යාපෘතිය පිළිබඳව සිදු කළ භෞතික පරීක්ෂාවේදී ඇළ මාර්ගයේ පතුල ආරම්භයේ සිට 40m දක්වා කොටස සකසා නොතිබීම නිසා ඇළ මාර්ගයේ පහළින් පිහිටි නිවාසවලට ජලය කාන්දු වෙමින් පැවතුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | නුවරඑළිය ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් බවත් විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත විගණන විමසුම යොමු කර ඇති අතර, නොපමාව පිළිතුරු ලබා දෙන ලෙස දැනුම් දී ඇති බවත්, එම ආයතනය විසින් අදාළ පිළිතුරු ලද විගසම පිළිතුරු යොමු කරන බවත්, අඩුපාඩු සකස්කර ගැනීමට ද කටයුතු යොදන බවත්, දන්වා ඇත. |
| (ඉ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.1,000,000 ක ප්‍රතිපාදන යටතේ ඉදිකළ සේරුපිටිය ඉහළ මාර්ගය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව නිම කර තිබුණි. 2020 පෙබරවාරි 07 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී මාර්ගය දෙපස (Shoulder) සකස් කර නොතිබුණ අතර, රැඳවුම් බැම්මක් යෙදිය යුතු අත්‍යාවශ්‍යම ස්ථානයක් පැවතියද, ඒ පිළිබඳව නොසලකා මාර්ගය ඉදිකර තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි සංවර්ධන යෝජනා වලදී මෙහි බැම්මක් ඉදි කිරීමට අදාළව යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කළ පීඩaa වත්ත මාර්ගය සංවර්ධනය හා පැති බැම්ම ඉදිකිරීම් කර්මාන්තය ක්‍රියාත්මක කර තිබුණි. 2020 මාර්තු 03 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී රු.1,278,435 ක් වැය කර මාර්ගය සඳහා පැති බැම්මක් ඉදිකර තිබුණි. එම පැති බැම්ම අනුමත සැලැස්මට අනුව ඉදිකර නොතිබුණු අතර බැම්මේ වීප්හෝල් තැබීමේදී කිහිපයක් සිනෙස් මතින් බැහැරව තබා තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | 2019 වර්ෂය තුළ විවිධ වැඩ සටහන් යටතේ ව්‍යාපෘති ඉදි කිරීම් විශාල ප්‍රමාණයක් කාර්මික නිලධාරීන් දෙදෙනෙක් හා තාක්ෂණ සහායක නිලධාරියෙක් වනසේ තිදෙනෙක්ගේ අධීක්ෂණය යටතේ කරවා ගැනීමට සිදු වූ අතර මෙවැනි දෝෂයන් සිදු නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |
| (උ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කළ රු.3,000,000 ක ප්‍රතිපාදන මත කර්කස්වර්ල්ඩ් පහළ කොටස පාලම ඉදිකිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම පාලම පිළිබඳව 2020 මාර්තු 06 දින සිදු කළ භෞතිකව පරීක්ෂා කිරීමේදී දෙපස වින්වෝල් ආදිය සඳහා යොදා තිබූ කොන්ක්‍රීට් ප්‍රමිතියෙන් තොර වූ අතර මීවද දෝෂ පැවතුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | කොන්ක්‍රීට් ප්‍රමිතියෙන් තොර බවට විගණනයෙන් පෙන්වා දී ඇති ස්ථානයන් පිළිබඳව හැමර් පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු දැනුවත් කර ඇත. වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඌ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,000,000 ක ප්‍රතිපාදන මත හැටන් ඇබොස්ට්ලිවත්ත ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රමාණ පත්‍රයේ එක් අයිතමයක් වන රැඳවුම් බැම්ම ඉදිකිරීම සඳහා රු.559,480 ක් ගෙවීම් කර තිබුණු අතර බැම්මේ පැවැත්ම තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍යවන රැඳවුම් බැම්මේ ජලය බැසයන නළ තැබීම සඳහා රු.7,003 ක් ගෙවීම් කර තිබුණ ද, ජලය බැස යන නළ අසළ කැටගල් තැන්පත් කිරීම සිදුකර | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | මෙම කර්මාන්ත සඳහා රැඳවුම් මුදල් ගෙවීමට ප්‍රථම මෙම අඩුපාඩු සැකසීම පිණිස සටහන් කර ගත් බවත්, කොන්ක්‍රීට් ප්‍රමිතයෙන් තොර බවට විගණනයෙන් පෙන්වා දී ඇති ස්ථානයන් පිළිබඳව හැමර් පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු දැනුවත්කර ඇති බවත් වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කරන බවත් දන්වා ඇත. |

නොතිබුණි. ක්‍රීඩාගාරයේ ගෙබිම වෙනුවෙන් රු.76,456 ක් වැය කර තිබුණත්, එය ඉරිතලා තිබුණි. පොළොවේ කපරාරුව (Rendering) 1 ½" පමණ වූ ස්ථාන පැවතුණි. පැති කානු වෙනුවෙන් රු.81,980 ක් වැය කර තිබුණු අතර 2020 මැයි 31 දින වන විටත් එය පුපුරා තිබූ අතර, දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් භාවිතා කර තිබුණි.

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ගම්පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ආගමික ස්ථාන සඳහා සූර්ය බලශක්ති පහසුකම් ලබාදීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කය වෙත රු.42,500,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන වලින් සූර්යබලශක්ති පද්ධති 55 ක් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2019 අගෝස්තු මාසයේ දී රු.23,479,500 ක ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු 2019 දෙසැම්බර් 31 දිනට සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කර අවසන් කළ යුතු වුවද, පරීක්ෂා කරන ලද ව්‍යාපෘති 05 ක් විගණිත දින වූ 2020 පෙබරවාරි 13 දින වන විටත් | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | මෙම ව්‍යාපෘති සඳහා මුදල් ගෙවීම සම්පූර්ණ වශයෙන් මේ විගණන විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු ක්ෂේත්‍ර පරීක්ෂාවේදී හඳුනා ගන්නා ලද අතර එම අඩුපාඩු සකස් කිරීමෙන් අනතුරුව මුදල් ගෙවීම් කටයුතු කිරීමට අදාළ පාර්ශව වෙත උපදෙස් ලබා දී ඇති බවත් විදුලි බල මණ්ඩලය සමග ගිවිසුම්ගත වී ඇත්තේ අදාළ ආගමික ස්ථානය බැවින් ඊට අදාළ කටයුතු මේවන විට සිදුකරමින් පවතින බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | එම වැඩ නිමකර නොතිබුණි. වැඩ අවසන් කළ කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ව්‍යාපෘතිවල සූර්ය පැනල් නිසි ලෙස තිරස්ව සවිකර නොතිබීම, පිරිවිතරවලින් බැහැරව අඩුවෙන් බේකර් යෙදූ අවස්ථා 05 ක් පැවතුණි. | | |
| (ආ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම්පෙරලිය වැඩසටහන යටතේ ඇල්මාවත්ත සීටන් කොටස ක්‍රීඩාපිටිය ඉදිකිරීම වෙනුවෙන් රු.2,000,000 ක වැයකර තිබුණි. 2020 පෙබරවාරි 18 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී පිට්ටනිය කැපීමේදී විශාල වශයෙන් කලුගල් මතුවී තිබූ අතර, ඒවා පිට්ටනියෙන් ඉවත් කිරීම ප්‍රමාණවත් නොවූයෙන් පිට්ටනිය භාවිතා කළ නොහැකිව පැවතුණි. පිට්ටනිය මට්ටම් කිරීමේ කාර්ය ඇස්තමේන්තු කර නොතිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිය යුතු වීම. | ලද මුදල් ප්‍රමාණය අනුව ක්‍රීඩා පිටිය ඉදි කිරීමේ අත්‍යාවශ්‍ය අංග මූලිකවම සිදු කොට, අදාළ ගෙවීම සිදු කර ඇති බවත් අධිගෙවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ඇති අතර අධි ගෙවීම් ගණනය කර 2020 මැයි 22 දින රු.193,400 ක් අයකර රජයේ ආදායමට බැරකර ඇති බවත් ගල් කඩා ඉවත් කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත් සමිතිය දැනුවත් කර ඇති අතර සමිතිය එම කාර්යය කිරීමට එකග වී ඇති බවත් තවදුරටත් අයවිය යුතු අධිගෙවීම් මුදලින් එම කාර්යය ඉටුකර ගැනීමට අපේක්ෂිත බවත් දන්වා ඇත. |
| (ඇ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ රොබ්හිල්වත්ත මාර්ගය කාපට් කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.7,026,669 ක වටිනාකමක් මත ගිවිසුම්ගත වී තිබුණි. එම ව්‍යාපෘතියේ රු.6,414,560 ක වැඩකොටස් ඉටුකර තිබුණි. මෙහිදී මාර්ගය දෙපස කාණු යෙදීම සිදු කර නොතිබූ අතර, අත්‍යාවශ්‍ය අයිතමයන් ඉටු නොකිරීම හේතුවෙන් මාර්ගය දෙකෙළවර (edge) 2020 මාර්තු 10 දින වන විටත් කැඩී බිඳී ගිය ස්ථාන පැවතුණි. තවද, මාර්ගය නිසි ලෙස තැලීම් කර නොමැති ස්ථාන රාශියක් | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිය යුතු වීම. | නිසි පරිදි සම්පිණ්ඩනය නොවූන ස්ථාන සම්පූර්ණ කරන ලෙස ද මාර්ගයේ දෙකෙළවර ඇති මාර්ග සලකුණුවල අඩුපාඩු ද නැවත සකසන ලෙස කොන්ත්‍රාත් සමාගම වෙත දන්වා ඇති අතර රු.25,000 ක ගෙවීම් සිදුකර ඇත්තේ කොන්ත්‍රාත් කාලය තුළ දී ඉමල්ෂන් ඇතිරීම ඇස්පෝල්ට් ඇතිරීම වැනි අවස්ථාවල යොදා ඇති සංඥා පුවරු, කොඩිකණු යෙදවීම, බාධක පටි යෙදීම වැනි අදාළ සංඥා සඳහා කරන ලද ගෙවීමක් ලෙස බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණි. මාර්ගයේ ඇතැම් ස්ථානවලින් මාර්ගය තුළට ජලය කාන්දු විය හැකි ස්ථානද පැවතුණෙන් මාර්ගය තුළට ජලය කාන්දුවීමේ අවදානමක් පැවතුණි. මාර්ගයේ දෙපස යොදා තිබූ සුදු ඉරි (Road edge Marking) සියල්ල මේ වන විට පිපිරීමට ලක්වී තිබූ අතර අවශ්‍ය සංඥා පුවරු(Road Signs, Markings,Lights) කිසිවක් යොදා නොතිබුණද ඒ සඳහා රු.250,000 ක්ගෙවා තිබුණි. | | |
| **(ඈ)** | අඹගමුව සමෘද්ධි බැංකුව අසලින් ආරම්භ වන පාසල් ජනපද මාවත තාර දැමීමේ කර්මාන්තය නිම කර තිබුණි. 2020 මාර්තු 10 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ඉදිකළ කොන්ක්‍රීට් කාණු බොහොමයක් මාර්ගයට වඩා 6" පමණ ඉහළින් සකසා මාර්ගයේ ජලය, කාණු තුළින් බැස යා නොහැකිව පැවතියද සහතික කළ බිල්පත්වල වටිනාකම රු.1,106,873 ක් වී තිබුණි. | මාර්ගයේ ජලය බැස යන පරිදි කාණු ඉදිකළ යුතු වීම. | මාර්ග තලයට වඩා උස්ව පවතින කොන්ක්‍රීට් කාණු ජලය බැසයන ආකාරයට සකස් කිරීමට කොන්ත්‍රාත්කාර සමිතියට දන්වා ඇති අතර නිවැරදි කිරීමෙන් පසු වාර්තා කරන බව දන්වා ඇත. |

**3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රදේශයේ පැපිනෝ වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් 2019 මැයි 02 දින රු.1,116,938 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මේ සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කරන විට ප්‍රතිලාභීන් 11 දෙනෙකු හඳුනාගෙන තිබුණි. නමුත් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සඳහා ඔවුන්ගේ උනන්දුව අඩුවීම | ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 අප්‍රේල් 21 දින ඇති වූ තත්ත්වය මත සංචාරකයන්ගේ පැමිණීම අඩු වූ බැවින් පැපිනෝ සඳහා සංචාරක හෝටල්වල ඉල්ලුම අඩුවීම නිසා මිල පහත වැටීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට ප්‍රධාන තම හේතුවක් වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | හේතු වූ බව සඳහන් කරමින් ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා තිබුණි. | | |
| (ආ) | නයි මිරිස් වගා ව්‍යාපෘතියක් සඳහා රු.2,927,775 ක ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2019 සැප්තැම්බර් 25 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. ව්‍යාපෘති යෝජනාව අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීම 2019 ජනවාරි මාසයේ දී සිදු කළ යුතුව තිබුණි. මාස 10 ක ප්‍රමාදයකින් පසු 2019 ඔක්තෝබර් 28 දින ප්‍රතිලාභීන් හඳුනාගෙන තිබුණි. එම ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 දායකත්වය ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. පොලිටනල් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන හරවා යවා ව්‍යාපෘතිය අත්හැර තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති වාර්තාවට අනුමැතිය ලැබෙන විට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ඇස්තමේන්තුව වෙළඳපොළ මිල ගණන් ඉක්මවා ගොස් තිබූ බැවින් නැවත ඇස්තමේන්තුවක් එදිනම ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2019 ඔක්තෝබර් 11 දින ය. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකළ අතර ජනාධිපතිවරණය ද එම කාල සීමාව තුළ පැවතීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට හැකියාව නොලැබුණු බව දන්වා ඇත. |
| (ඇ) | දෙමුහුම් මිරිස් බීජ නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපෘතියක් සඳහා රු.3,080,000 ක වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ දළ වශයෙන් ප්‍රතිලාභීන් 235 ක් පමණ සේවයේ නියුක්ත කළ හැකි බවට හඳුනාගෙන තිබුණි. ව්‍යාපෘති කාල රාමුවට අනුව ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාස වලදී උපකරණ මිලදී ගැනීම සහ ස්ථාපිත කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. 2019 අගෝස්තු මාසය වන විට ප්‍රතිපාදන මුදල අනුමත වී තිබූ නමුත් යන්ත්‍ර / ශීත ගබඩා මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කැඳවීම ප්‍රමාද වීමත් අදාළ භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතන නිසි පරිදි හඳුනා නොගැනීමත් නිසා මෙම ප්‍රතිපාදන හරවා යවා ව්‍යාපෘතිය අත්හැර තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති 07 ට පුහුණුව සඳහා විශාල වියදමක් වැයවන බැවින් අනුමැතිය ලද පසු හඳුනාගත් ප්‍රතිලාභීන් කොටසක් පුහුණු කිරීමට නියමිත වුවත් ව්‍යාපෘතිය අනුමත වනතුරු ප්‍රතිලාභීන්ගේ දායකත්වය සියයට 50 ලබාගෙන ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රතිලාභීන්ගේ එකඟතාවය ලබා ගැනීම හැකියාවක් නොමැති වූ බවත්. මිල ගණන් කැඳවීමට දැනුම් දීමට කාලය ගතවී ඇත්තේ යන්ත්‍ර හා ශීත ගබඩා පිළිබඳ පිරිවිතර සකස්කර ගැනීම කාලය ගත වූ බැවින් බව දන්වා ඇත. |

## 3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | නුවරඑළිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ තිලානිවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම ව්‍යාපෘතියේ ගිවිසුමට අනුව 2019 ඔක්තෝබර් 08 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 18 දින වැඩ නිම කළ යුතුව තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රු.19,931,926 කට පෞද්ගලික ආයතනයකට පවරා තිබුණද, 2020 මාර්තු 06 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී රු.14,089,212 ක හෙවත් ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 70 ක වැඩ පමණක් නිම කර තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරිමට කටයුතු කළ යුතුවිම. | මෙම කර්මාන්තය සඳහා සියයට 70 ක් ගෙවීම් කිරීමට සිදු වූයේ 2019 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තයට අදාළව නිම කරන ලද වැඩකොටස් සඳහා පමණක් කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් බව දන්වා ඇත. |
| **(ආ)** | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ කර්කස්වර්ල්ඩ් පහළ කොටස පාලම ඉදිකිරීම ව්‍යාපෘතියේ ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව 2019 මාර්තු 25 දින ආරම්භ කර 2019 සැප්තැම්බර් 25 දින නිම කළ යුතුව තිබුණි. 2019 නොවැම්බර් 30 දින කර්මාන්තයේ වැඩ නිම කළ බවට බිල්පත් සකස් කර තිබුණි. අතැති බිල්පත් ලෙස රු.1,940,000 ක බිල්පත් රඳවාගෙන තිබුණද, විගණිත දිනය වූ 2020 මාර්තු 06 දින වන විටත් කර්මාන්තයේ වැඩ නිම කර නොතිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම් ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. ඉටු නොකළ වැඩ සඳහා බිල්පත් සකස් කිරීමෙන් වැළකිය යුතු වීම. | පාලම ඉදිකිරීමට යෝජිත ස්ථානයෙන් කපා ඉවත් කරණු ලබන පස්වල ඉල්ලම් පස් තිබිය හැකි බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් දන්වනු ලැබීමෙන් පසුව හා එම පස් නිත්‍යානුකූලව ඉවත් කර ගැනීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස්කර ගැනීමට නොහැකිවීම මත ගිවිසුම් ප්‍රකාරව පාලමේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ බගතුලුව ධීවර මධ්‍යස්ථානය අසල සිට දෙකිඳ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මාර්ගයේ දිග මීටර් 136ක් ද පළල මීටර් 3.1 ක්ද යුතුව වැඩ නිම කළ බවට 2019 නොවැම්බර් 30 දින රු.736,135 ක අවසන් බිල්පත් සකස් කර අත රඳවා ගෙන තිබුණි. විගණන දින වූ 2020 මාර්තු 10 දින වන විටත් මාර්ගයේ දිගින් මීටර් 79.5 ක් පමණක් තාර දමා සංවර්ධනය කර තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. ඉටු නොකළ වැඩ සඳහා බිල්පත් සකස් කිරීමෙන් වැළකිය යුතු වීම. | වසර අවසානයේදී ඇතිවූ මුදල් හිඟය හේතුවෙන් කර්මාන්තවල වැඩ නිම කිරීම තුළින් තමන් මූල්‍යමය අපහසුතාවයන්ට පත්විය හැකි බව කොන්ත්‍රාත්කාර සමිති බියට පත්වීම හේතුවෙන් වැඩ ප්‍රමාද වූ බවත් එම හේතු නිසාවෙන් සමහරක් කර්මාන්ත ඇස්තමේන්තු ප්‍රකාරව සියයට 100 ක් වැඩ නිමකර ගැනීමට නොහැකි වූ බවත් දන්වා ඇත. |
| (ඈ) | ගම්පෙරළිය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ අඹගමුව සමෘද්ධි බැංකුව අසලින් ආරම්භ වන පාසල් ජනපද මාවත තාර දැමීම කර්මාන්තයේ හා අඹගමුව කුල්බෝන් පාර තාර දමා සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ දෙවන වර තාර ආලේපය විගණිත දින වූ 2020 මාර්තු 10 දින වන විටත් සිදු කර නොතිබුණි. නමුත් වැඩ නිම කළ බවට පිළිවෙලින් රු.1,749,257 ක් හා රු.1,738,860 ක බිල්පත් 2019 නොවැම්බර් 30 දිනට සකස් කර තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. ඉටු නොකළ වැඩ සඳහා බිල්පත් සකස් කිරීමෙන් වැළකිය යුතු වීම. | විගණනයෙන් පෙන්වා දෙන ආකාරයට 2020 මාර්තු 10 දින වන විටත් දෙවනවර තාර ආලේපය සිදුකර නොතිබූ බව පිළිගන්නා අතර මේ වනවිට එම වැඩ අවසන්ව ඇති බව වාර්තා කර ඇත. එසේම කර්මාන්තයේ අවසන් ගෙවීම කොන්ත්‍රාත්කරු වෙත සිදුකර නොමැති බවද දන්වා ඇත. |

## 3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ තිබ්බටුගොඩ විහාරය තෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම හා ධාතු මන්දිරය ඉදිකිරීම සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් රු.2,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ලැබෙන සංවර්ධන යෝජනා අනුව සහ දායක සභාවේ ඉල්ලීම මත අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති අතර, මෙම වර්ෂයේ ලද ප්‍රතිපාදනවලට අනුව යෝජනා වී ඇත්තේ ධාතු මන්දිරය ඉදි |

| | |
|---|---|
| උපයෝජනය කර කොන්ත්‍රාත්තුව ඉටු කර තිබුණි. මගේඅංක CL/NE/A/WAL/2019/6 හා 2019 මාර්තු 11 දිනැති විගණන විමසුම මගින් පෙන්වා දුන් පරිදි මෙම විහාරස්ථානය සඳහා වසර 04 ක කාලයක් තුළ රජය විසින් රු.6,873,981 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය. | කිරිමට සහ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීමට බව දන්වා ඇත. |
| (i) ඇස්තමේන්තුව අනුව රු.90,000 ක් වැයකර ඉදිකරන ලද නාන කාමර සඳහා සවි කළ නාන බේසම හා කොමඩ් සම්මත ප්‍රමිතියෙන් තොරවූ අතර, ඒ සඳහා වගකීම් කාලයක්ද ලබා දී නොතිබුණි. | ප්‍රමිතියෙන් තොර නාන කාමර උපාංග සවි කිරිම සම්බන්ධයෙන්ද, ඒවා ඉවත් කරන ලෙස අදාළ කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති අතර, එම කටයුතු අවසන් වන තෙක් ගෙවීම් කටයුතු ප්‍රමාද කර ඇති බව දන්වා ඇත. |
| (ii) මාර්ගයේ දෙපස යා කර ඉදිකර තිබූ පාලමට ඉහළින් ආවරණ වහලක් ඉදි කිරීම සඳහා රු.109,500 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම වහලයේ රෙජීන් යොදනු වෙනුවට සෙවිලි තහඩුම නමා මුදුනත ප්‍රමිතියෙන් තොරව සකස් කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වහලයේ පැවති අඩුපාඩු මේ වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (iii) දොරවල් සඳහා රු.243,352 ක් ඇස්තමේන්තු කර තිබූ අතර දොර ලොක් සඳහා රු.60,350 ඇස්තමේන්තු කර තිබුණි. නමුත් සවිකර තිබූ දොරවල් සඳහා දොර අගුලු යොදා නොතිබුණි. තවද, එලය සහිත දැව යොදා ගෙන අඩුපාඩු සහිත කොටස්වලට ලී පටි යොදා ගෙන දොරවල් ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි. | ප්‍රමිතියෙන් තොර දොරවල් ගලවා ඉවත් කර, නැවත ප්‍රමිතියෙන් යුත් දොරවල් සහ දොර ලොක් යොදන ලෙස උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. මෙහි ගෙවීම් කටයුතු තාවකාලිකව නවතා ඇති බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නායයාමේ දැඩි අවදානම් ස්ථානවල ජීවත්වන පුද්ගලයන් යළි පදිංචි කිරීමට වෙදමුල්ල ලිලීස්ලැන්ඩ් වතුයායේ නිවාස 105 ක් ඉදිකිරීම සඳහා පළමු වාරිකය වශයෙන් රු.21,000,000 ක ප්‍රතිපාදන ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2018 ජූලි 23 දින කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. 2018 වර්ෂය තුළ අදාළ ව්‍යාපෘති කටයුතු ආරම්භ නොකිරීම නිසා ප්‍රතිපාදන මුදල් ආපසු හරවා යවා තිබුණි. 2019 වර්ෂයේ දී ඉහත ව්‍යාපෘතිය යටතේම වැවිලි මානව සම්පත් සංවර්ධන භාරයේ අධීක්ෂණය යටතේ නිවාස 40 ක ඉදිකිරීම් සඳහා රු.8,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම නිවාසවල අත්තිවාරම් බැඳීම සඳහා පිළිවෙළින් 2019 මැයි 05 දින සහ 2019 නොවැම්බර් 26 දින ගිවිසුම්වලට එළඹ තිබුණි. 2019 දෙසැම්බර් 23 දින සිදු කළ ස්ථාන පරීක්ෂාවේදී අත්තිවාරම් බැඳීමේ කටයුතු නිවාස 27 ක පමණක් ආරම්භ කර තිබුණි. 2019 මැයි 05 දින අත්සන් කළ ගිවිසුමට අනුව නිවාස 20 ක අත්තිවාරම් බැඳීමේ කටයුතු 2019 ජූනි 05 දින වන විට නිම කළ යුතු වූ තිබුණත්, නිවාස 02 ක පමණක් එම කටයුතු නිමකර තිබුණි. ඉතිරි නිවාස 58 හි අත්තිවාරම් කටයුතු නිම කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් රු.11,600,000 ක් ලැබී තිබුණු අතර එය වැවිලි මානව සම්පත් සංවර්ධන භාරය විසින් 2019 දෙසැම්බර් 31 දින කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත ආපසු හරවා යවා තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | නිවාස ඉදි කිරීම සඳහා වසර 3 කට පසු වතු අධිකාරියෙන් හා භාණ්ඩාගාරයෙන් මෙම ඉඩම නිදහස් වූ අතර ප්‍රතිලාභීයා විසින්ම නිවස ඉදිකිරීම අපහසු වන බැවින් මෙම කාර්යය සිදු කර ගත හැකි වන්නේ ඒ වන විටත් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඉදි කරනු ලබන නිවාස සඳහා ඉඩමේ හිමිකම ලබා දෙන ආකාරයට මේ පිරිස් සඳහාත් ඉඩමේ අයිතිය ලබා දිය හැකි වන අතර ඒ සඳහා එම අමාත්‍යාංශය යටතේ මෙම නිවාස ඉදි කිරීම සිදු කරවා ගත යුතුවේ. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අනු ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරය හරහා නිවාස ඉදි කර ගැනීමට 2019 දෙසැම්බර් 27 දින ඒ සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් කොන්දේසිවලට යටත්ව අනුමැතිය ලැබුණු බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නායයාමේ දැඩි අවදානම් ස්ථානවල ජීවත්වන පුද්ගලයන් යළි පදිංචි කිරීම සඳහා 2017 වර්ෂයේ ඇස්තමේන්තුවකට 2019 වර්ෂයේදී ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ නිසා නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව 1087 ක් වූ නමුත්, පවුල් 177 ක් සඳහා පමණක් නිවාස ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ඈ) | නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් 2018 වර්ෂයේ ව්‍යාපෘති 25 ක් සඳහා රු.56,825,000 ක්ද, 2019 වර්ෂයේ ව්‍යාපෘති 39 ක් සඳහා රු.81,347,300 ක්ද, ඉල්ලුම් කර තිබුණි. 2018 සහ 2019 වර්ෂවල දී ප්‍රතිපාදන ලැබීම් අවම මට්ටමක පැවතුණි. 2019 වර්ෂයේ දී එක් ව්‍යාපෘතියක් සඳහා පමණක් රු.1,994,258 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. යෝජනා සම්බන්ධ විස්තරාත්මක වාර්තා අනුව හඳුනාගත් ඇතැම් ව්‍යාපෘති සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සෑම වර්ෂයකම යෝජනා ඉදිරිපත් කර තිබුණි. 2019 වර්ෂයේදී ප්‍රතිපාදන ඉල්ලුම් කළ ව්‍යාපෘති 39 ක් අතරින් ව්‍යාපෘති 12 ක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් අවදානම් කළාප ලෙස නම් කර තිබූ ස්ථානවල සිදුකළ යුතු ව්‍යාපෘති වී තිබුණි. ආපදා අවම කර ගැනීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා පසුගිය වර්ෂවල ඇතිවූ විවිධ ආපදා තත්ත්වයන්හිදි පදිංචි ජනතාව එම ප්‍රදේශවලින් ඉවත් කිරීමටද සිදුවූ අවස්ථා පැවතුණි. | ආපදා අවම කර ගැනීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | සමාලෝචිත වර්ෂයේදී නුවරඑළිය දිස්ත්‍රික්යේ යළි පදිංචි කිරීමේ කටයුතු සඳහා රු.49,200,000 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණි. ඉන් රු.27,988,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබූ අතර රු.21,012,000 ක් හෙවත් සියයට 43 ක ප්‍රතිපාදන ඉතිරිවී ආපසු හරවා යැවීමට කටයුතු කර තිබුණි. | ආපදා අවම කර ගැනීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| **(ඊ)** | දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය මඟින් සමාලෝචිත වර්ෂය තුළ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 07 ක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘති යෝජනා 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රු.21,950,910 ක ප්‍රතිපාදන වර්ෂය තුළදී ලැබී තිබුණි. ඉන් එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2019 නොවැම්බර් 20 දිනැති අංක BD/GPS/155/09/01/HA-2019 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියට අනුව රු.7,124,713 ක ප්‍රතිපාදන ඉතිරි වී ආපසු හරවා යවා තිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසීමට කටයුතු කළ යුතු වීම. | 2019 අප්‍රේල් 21 දින ඇති වූ තත්ත්වය මත සංචාරකයන්ගේ පැමිණීම අඩු වූ බැවින් පැපිනෝ සඳහා සංචාරක හෝටල්වල ඉල්ලුම අඩුවීම, ව්‍යාපෘති වාර්තා සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාදවීම යන්ත්‍ර හා ශීත ගබඩා පිළිබඳ පිරිවිතර සකස්කර ගැනීම කාලය ගතවීම වැනි හේතු මත, ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. |

## 3.8 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ළඟා කරගත් විශේෂ ඉලක්කයන් ලෙස, ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයෙන් ලබාගත් මූල්‍යමය හා | සැලැසුම් කළ ව්‍යාපෘති ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි අනුමත | |

| | | | |
|---|---|---|---|
| | භෞතික කාර්යසාධනය හා විවිධ නව ආදායම් මාර්ග හඳුනාගැනීම් දක්වා තිබුණි. නමුත් ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයෙන් ඉකුත් වර්ෂයේ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ ව්‍යාපෘති 15 කින් ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්හැර තිබුණු අතර ක්‍රියාත්මක තත්ත්වයේ පැවති කර්මාන්තවලද ඉලක්ක හා භෞතික තත්ත්වය පහත පරිදි විය. | ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | |
| (i) | ගෝවර තෘණ වගාකරුවන්ගේ වාර්ෂික ආදායම ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ යටතේ තෘණ වගා කිරීමේ කටයුතු 2018 පෙබරවාරි මාසයේ දී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණු අතර එය 2018 ජුනි මාසය දක්වා ප්‍රමාද කර තිබුණි. ව්‍යාපෘති වාර්තාව අනුව, තෘණ ප්‍රවාහනය සඳහා ලොරි රථයක්, තෘණ කැපීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණු අතර 2019 දෙසැම්බර් මාසය වන විටත් ඒවා මිලදී ගෙන නොතිබුණි. අක්කර 50 කපමණ භූමිප්‍රමාණයක තෘණ පැළ වගා කිරීමට සැලැසුම් කර තිබුණද, වගා කර තිබුණු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 17 ක් හෙවත් සියයට 34 ක් පමණක් වී තිබුණි. තෘණ පැළ අලෙවි කිරීමේ කටයුතු 2019 මාර්තු මාසයේ සිට ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. ගොවීන් 70 ක් අතරින් එක් ගොවියකුගේ තෘණ පැළ කිලෝ ග්‍රෑම් 871 ක් පමණක් අලෙවි කර තිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති සැලැසුම් කළ යුතුවීම හා අනුමත කළ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | වතු අධිකාරිත්වය තෘණ පැල සිටුවීම සඳහා හිස් ඉඩම් නිදහස් කිරීමට වාචිකව කැමැත්ත ප්‍රකාශ කර තිබුණද, වතු අධිකාරිත්වය ලිඛිතව ඉඩම් නිදහස් නොකිරීම ව්‍යාපෘතිය ආරම්භ කිරිම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූ බවත්, 11 වන අදියර ප්‍රතිපාදන වලින් තෘණ ප්‍රවාහනය සඳහා ලොරි රථයක් ලබා ගැනිමට අපේක්ෂිත බවත්, ඉඩම් හෙළිපෙහෙළි කර වලවල් සැකසීම ඉතාමත් ක්‍රමාණුකූලව පශු වෛද්‍ය උපදෙස් මත කළයුතු වූ බැවින් ප්‍රමාදයට හේතු වූ බවත් දන්වා ඇත. |
| (ii) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ මල් වගාකරුවන්ගේ ආදායම ඉහළ නැංවීමේ ව්‍යාපෘති යෝජනාව අනුව ආරක්ෂිත ගෘහ 32 ක් ඉදිකිරීමේ කටයුතු 2019 ජනවාරි මාසයේ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. එය 2019 නොවැම්බර් 28 දින තෙක් ප්‍රමාදවීම නිසා ව්‍යාපෘතිය | ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති සැලැසුම් කළ යුතුවීම හා අනුමත කළ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2019 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලැසුම් සකස් කර තිබුණත්, ඒ සඳහා ප්‍රතිපාදන ජුලි මාසයේදී ලැබී තිබුණි. සියලුම ආරක්ෂිත |

| | | | |
|---|---|---|---|
| | සාර්ථකව කරගෙන යාමට බාධාවක් වී තිබුණි. | වීම. | ගෘහවල ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති බව දන්වා ඇත. |
| (iii) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙන්චර් ග්‍රාම නිලධාරි වසමෙහි කිරි නිෂ්පාදකයන්ගේ ආදායම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා රු.908,635 ක් වැයකර අවශ්‍ය යන්ත්‍ර 2018 දෙසැම්බර් මාසයේ දී මිලදී ගෙන තිබුණි. 2019 අගෝස්තු මාසයේදී ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණි. වසමේ පිහිටා ඇති දේවස්ථාන ගොඩනැගිල්ලක තාවකාලිකව නිෂ්පාදන කටයුතු සිදුකර ගෙන යනු ලබන අතර, ඒ සඳහා නිශ්චිත ස්ථානයක් නොමැතිවීම සහ ඉල්ලුමට සරිලන පරිදි සැපයුම ලබාදීම සඳහා ප්‍රවාහන කටයුතු සිදුකර ගැනීමට වාහනයක් නොමැතිවීම ව්‍යාපෘතිය සාර්ථකව කරගෙන යාමට බාධාවක් වී තිබුණි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා බාධාවන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘති වෙන්චර් වසමේ සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර අනුමැතිය ලද යෝජනාවෙහි සඳහන් ව්‍යාපෘති කාල රාමුවෙහි ක්‍රියාකාරකම් හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල පරාසයන් ප්‍රායෝගික හේතූන් මත වෙනස් වී ඇත. ස්ථිර ස්ථානයක් තෝරාගන්නා තෙක් තාවකාලිකව ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා දේවස්ථාන ගොඩනැගිල්ල මෙම ව්‍යාපෘතිය පවත්වාගැනීම සඳහා තෝරාගන්නා ලද බවත් දන්වා ඇත. |
| (iv) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජම්බුතැන්න ග්‍රාම නිලධාරී වසමෙහි කුළුබඩු වියළා අගය එකතු කිරීම මඟින් කෘෂි නිෂ්පාදකයන්ගේ ආදායම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රතිපාදනවලින් රු.827,310 ක් වැයකර 2018 දෙසැම්බර් මාසයේ දී උපකරණ මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු මාසයේදී ආරම්භ කර තිබුණි. සමිතියේ සාමාජිකයන් 83 දෙනෙකු අතරින් සාමාජිකයන් 05 දෙනෙකු පමණක් ව්‍යාපෘතියේ කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී තිබුණි. 2019 මාර්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ව්‍යාපෘතිය මඟින් | ආරම්භ කරනු ලබන ව්‍යාපෘතිවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී අවශ්‍ය උපකරණ මිලදී ගනු ලැබුවද, විජලන යන්ත්‍රයේ මෝටරය සවි කිරීමේදී කාර්මික දෝෂයකට ලක්වූ බවත්, මෝටරය අලුතින් රැගෙන විත් සවි කිරීම 2019 අප්‍රේල් 24 දින සිදු කරන ලද බවත්, කැපවීමෙන් ක්‍රියා කළ හැකි අමතර ආදායම් උත්පාදන ක්‍රියාවලියක නිරත නොවන කුඩා කණ්ඩායම් කිහිපයක සාමාජිකයින් පස් |

| | | | |
|---|---|---|---|
| | උපයාගෙන තිබූ ආදායම රු.19,475 ක් පමණක් වී තිබුණි. | | දෙනෙකු ව්‍යාපෘතියේ කටයුතුවලට සම්බන්ධ බවත් දන්වා ඇත. |
| (v) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැලිවල දකුණ ග්‍රාම නිලධාරී වසමේ කෙසෙල් කොළ යොදා ගනිමින් පරිසර හිතකාමී සෞඛ්‍ය ආරක්ෂිත "ලන්ච්ෂීට්" නිෂ්පාදනය කිරීම සඳහා රු.මිලියන 1.74 ක් වැයකර 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති කටයුතු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන කෙසෙල් පැළ මිලදී ගැනීම සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී නොතිබීම සහ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන විදුලි ධාරිතාවය පිළිබඳ අවධානයක් යොමු නොකර ඊට අදාළ ගොඩනැගිල්ල සඳහා වියදම් කර තිබීම නිසා ව්‍යාපෘතිය අසාර්ථක වී පසුව ව්‍යාපෘතිය අක්‍රිය වී තිබුණි. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පැළ ලබා ගැනීම ප්‍රමාද වුවද, ඉහත සඳහන් පරිදි ඉදිරි කටයුතු සැලැසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ ද නිලධාරීන්ගේ උත්සාහය පමණක් ඇතත්, කෙටිකාලීනව වැඩි ආදායමක් නොලැබෙන බැවින්, වසමේ ජනතාවගේ උනන්දුව ක්‍රමයෙන් අඩුවන බව නිරීක්ෂණය වූ බවත් ඒ අනුව ව්‍යාපෘතිය මෙම වසමේ ක්‍රියාත්මක නොකර, වෙනත් උනන්දුවක් ඇති ග්‍රාමශක්ති වසමකට ලබාදීම මඟින්, රජයේ මුදල් අවභාවිතාවීම වළක්වා ගැනීමට හැකියාව ලැබෙන බවත් දන්වා ඇත. |
| (vi) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූඩළුඔය දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ජීවත්වන ඇඳුම් මැසීමේ කර්මාන්තයේ නියුතු ප්‍රතිලාභීන් 35 දෙනෙකු සඳහා රු.1,559,687 ක් වියදම් කර මහන මැෂින් ලබාදී තිබුණි. ව්‍යාපෘතිය මඟින් ලබන ආදායමෙන් සමිතියේ සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වයක් ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායමෙන් සමිතියේ සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම. | ප්‍රතිලාභීන් වෙත ලබාදෙන ව්‍යාපෘති යෙදවුම්වල මුළු වටිනාකම ග්‍රාමශක්ති ජනතා සමිති අරමුදල වෙත වාරික වශයෙන් නැවත අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, මුළු මුදලම අයකරගත් පසු සමිති නිලධාරීන් හා සාකච්ඡා කර, උපයන ආදායමෙන් යම් මුදලක් සමිති අරමුදල වෙත අය කර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (vii) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොරමඩුල්ල ග්‍රාම නිලධාරී වසමෙහි හණ නිෂ්පාදනය ප්‍රවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,589,602 ක් වැයකර තිබුණි. 2019 මාර්තු 12 දින හණ නිෂ්පාදන යන්ත්‍රය මිලදී ගෙන තිබුණද, 2019 ඔක්තෝබර් මාසයේ දී හණ පැල සිටුවා තිබුණි. හණ කෙඳි නිෂ්පාදන යන්ත්‍රයක් රු.120,000 ක් වැය කර මිලදී ගෙන තිබුණද, කර්මාන්තයේ නිරත පුද්ගලයන්ට යන්ත්‍රය මඟින් හණ කෙඳි නිෂ්පාදනය කර ගැනීමේදී අතිරේක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. සම්ප්‍රදායික ක්‍රමයට කෙඳි නිෂ්පාදනය 2019 මාර්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සිදු කර එයින් රු.2,505 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | ආදායම වර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන් හණ කර්මාන්තය තම අමතර ආදායම් මාර්ගය බවට පත්කර ගත් ව්‍යවසායකයින් මුල් කරගෙන සිදු කරන ලද්දක් බවත් මෙම ව්‍යාපෘතියේ මූලික අංගයක් ලෙස අත්හරින ලද ගොඩනැගිල්ලක් සංවර්ධනය කර පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගත හැකි මධ්‍යස්ථානයක මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීමට සිදුවූ බවත් දන්වා ඇත. |
| (ආ) | ගම්පෙරළිය ව්‍යාපෘති 2881ක් ක්‍රියාවට නැංවීමට සැලැසුම්කර තිබුණද, 2019 දෙසැම්බර් 31 දිනට ඉන් ව්‍යාපෘති 2348 ක වැඩ අවසන් කර ව්‍යාපෘති 533 ක් අත්හැර තිබුණි. ගම්පෙරළිය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන 85ක් වෙත සූර්ය බලශක්ති පද්ධති මඟින් විදුලි උත්පාදනය සඳහා රු.42,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, විගණිත දිනය වූ 2020 මාර්තු 10 දින වන විටත් කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති සැලැසුම් කළ යුතුවීම හා අනුමත කළ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීමට විදුලි බල මණ්ඩලය සමඟ අදාළ ආගමික ස්ථාන ගිවිසුම් ගත විය යුතු බවත්, ඒ සඳහා කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බවත් දන්වා ඇත. |
| (ඇ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොන්ක්‍රීට් සැපයූ ආයතනයෙන්ම කොන්ක්‍රීට් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් ලබාගෙන නියැදියට ලක්වූ ව්‍යාපෘති 31 ක් සඳහා රු.47,220,750 ක් ගෙවීම් කර තිබුණි. | පරීක්ෂණ වාර්තා ස්වාධීන ආයතනවලින් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | රෙඩි මික්ස් ලබා දෙන ආයතනයේ ඉංජිනේරුවන් විසින් අත්සන් තබා සහතික කර ඇති තත්ව පරීක්ෂණ වාර්තා පිළිගෙන ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආපදා කළමනාකරණ අංශයේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි. යළි පදිංචි කිරීම සඳහා වන වැඩපිළිවෙල මන්දගාමී වූ අතර නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව 1087 ක් වී තිබුණද ,පවුල් 177 ක් සඳහා නිවාසවල අත්තිවාරම් බැඳීමේ කටයුතු දක්වා පමණක් වැඩ නිම කර තිබුණි. වර්ෂය තුළ දිස්ත්‍රික්කය පුරා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 144 ක් පැවැත්වීමට සැලැසුම් කළද පුහුණු වැඩසටහන් 33ක් පමණක් පවත්වා තිබුණි. | ආපදාවට ලක්වූ පුද්ගලයන් හට ප්‍රමුඛතාව ලබාදී ව්‍යාපෘති නිම කළ යුතු වීම. | වාර්ෂික සැලැස්මට අනුව දිස්ත්‍රීක්කය තුළ වැඩසටහන් 144 ක් හා ව්‍යාපෘති 17 සිදු කිරීමට ක්‍රියාකාරි සැලැස්මක් සකස්කරන ලද අතර 2019 වර්ෂය සඳහා සැලසුම් කළ සියළු වැඩ සටහන් වෙනුවෙන් ප්‍රතිපාදන නොලැබුණු බැවින් වැඩසටහන් සියල්ල සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ බව දන්වා ඇත. |
| (ඉ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 350 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් ව්‍යාපෘති 140 ක හෙවත් සියයට 40ක පමණක් වැඩ අවසන් කර තිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති සැලැසුම් කළ යුතුවීම හා අනුමත කළ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට හා ආර්ථික වර්ධනය වේගවත් කිරීමට සහය වීම රජය විසින් හඳුනාගෙන තිබූ බැවින් ඒ යටතේ ග්‍රාමීය මාර්ග, පාලම් ඉදි කිරීම යන ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලද බව දන්වා ඇත. |
| (ඊ) | දිස්ත්‍රික් වනිතා සංවර්ධන ඒකකය මඟින් වැඩසටහන් 8 ක් ක්‍රියාවට නැංවීමට ක්‍රියාත්මක සැලැස්මෙන් හඳුනාගෙන තිබුණද, කාර්යසාධන වාර්තාවේ වැඩසටහන් 5 ක ප්‍රගතිය පමණක් ඇතුළත් කර තිබුණි. | ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් සියලු ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දැක්විය යුතු වීම. | සියළු ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලැබී නොමැති අතර නිලධාරිනියගේ උත්සාහයෙන් රාජ්‍ය නොවන සංවිධානයන්ගේ මැදිහත්වීමෙන් මුදල් ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘති ඉටුකර ඇති බවත් දන්වා ඇත. |

**3.9 ප්‍රසම්පාදනයන්**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට අනුව, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක් විසින් භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවීමේදී මුද්‍රා තැබූ අවම වශයෙන් ලංසු 05 ක් ලබා ගත යුතුව තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඊට පටහැනිව ලංසු 05 කට අඩුවෙන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රියාත්මක කළ අවස්ථා අනාවරණය විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | කාර්යාලයේ අත්‍යවශ්‍ය රාජකාරි පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය ආයතනවලින් මිල ගණන් කැඳවා ෆැක්ස් යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රීඩා සමාජ ශාලාව සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට 2019 අගෝස්තු 21 දින ලියාපදිංචි තැපෑලෙන් ආයතන 06 කින් ලංසු කැඳවා තිබුණද, 2019 අගෝස්තු 21 දින වන විටම ආයතන 03 කින් ලංසු ලැබී තිබුණි. මෙම ආයතන 03 කොළඹ ප්‍රදේශයේ විවිධ තැන්හි පිහිටියද නුවරඑළිය උසාවි සංකීර්ණයේ පිහිටි උප තැපැල් කාර්යාලයෙන් එකවර මිල කියුම තැපෑලට යොමුකර තිබුණි. මිල ගණන් කැඳවීමට පෙර අදාළ ආයතනය තෝරා ගෙන ඇති අතර, පසුව ඊට ගැලපෙන පරිදි ලියවිලි සකස් කර රු.498,000 ක් වටිනා මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය උපරිම විනිවිදභාවයකින් සිදු කළ යුතුවීම. අධිගෙවීම් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුවීම. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කිරීමට අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) වෙත පවරා ඇති බවත්, ඒ අනුව එම වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වා ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු තීරණ සඳහා සහභාගී වූ නිලධාරීන් විසින් අත්සන් යෙදිය යුතු වුවද, අවස්ථා 04 කදී ප්‍රසම්පාදන තීරණ 04 ක් සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් අත්සන් යොදා නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය උපරිම විනිවිදභාවයෙන් ක්‍රියාවට නැංවිය යුතුවීම. | එකම දිනක් තුළ ප්‍රසම්පාදන තීරණ කිහිපයක් ගැනීම හේතුවෙන් ඇතැම් ප්‍රසම්පාදන තීරණ සඳහා අත්සන් යෙදීම සිදු කිරීමට අතපසු වී ඇත. මේ වන විට එම ප්‍රසම්පාදන තීරණ සඳහා අත්සන යොදා සම්පූර්ණ කර ඇති බව දන්වා ඇත. |

## 3.10 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, භාණ්ඩ වර්ග 09 කට අදාළ අයිතම් 15 ක් 2019 මැයි 31 දින වෙන්දේසි කර තිබුණද, විගණිත දිනය වූ 2020 පෙබරවාරි 10 දින වන විටත් අදාළ භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙන්දේසි කරන ලද භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවීම. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භාණ්ඩ වර්ග 09 ට අදාළ අයිතම් 15 ක් 2019.05.31 දින වෙන්දේසි කර තිබුණ ද, එය බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කිරීමට ප්‍රමාද වූ බව පිළිගන්නා බවත්, මේ වන විට අයිතමයන් 07 ක් බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත. |
| (ආ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයින්ගේ ක්‍රීඩා සමාජ ශාලාව අළුත්වැඩියා කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.578,492 ක් ද, 2018 වර්ෂයේදී රු.115,698 ක් ද වැයකර තිබුණද, විගණිත දින වූ 2020 ජනවාරි 03 දින වන විටත් එහි වහලය අලුත්වැඩියා කළ යුතුව පැවතුණි. | ගොඩනැගිල්ල අළුත්වැඩියා කර අදාළ කාර්යභාරයන් ඉටු කළ යුතුවීම. | මෙම ගොඩනැගිල්ල ඉතා පැරණි ගොඩනැගිල්ලක් වන බැවින් එහි පෞරාණික වටිනාකම රැක ගනිමින් අලුත්වැඩියා කළ යුතු බැවින්, 2020 වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන මත සම්පූර්ණ ගොඩනැගිල්ල නිසි පරිදි අලුත්වැඩියා කිරීමට කටයුතු සිදුකරමින් ඇති බව දන්වා ඇත. |
| (ඇ) | රාජ්‍ය සේවකයින්ගේ ක්‍රීඩා සමාජ ශාලාවෙහි මිල කළ නොහැකි වටිනාකමකින් යුතු ක්‍රීඩා උපකරණ පැවතිණි. භාරකරුවකු නොමැති, මෙම ස්ථානයේ පවතින ක්‍රීඩා උපකරණ නඩත්තු කිරීම සම්බන්ධයෙන් සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි. | ක්‍රීඩා සමාජශාලා හා උපකරණ සම්බන්ධයෙන් වගකිව යුතු අයකු පත් කර ඒවා ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | බොහෝ ක්‍රීඩා උපකරණ ඉතා පැරණි තත්ත්වයේ ඒවා වන අතර පරීක්ෂාවන් සිදුකර ක්‍රීඩා නිලධාරීන්ගේ උපදෙස් අනුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | රජයේ සේවකයන්ගේ ක්‍රීඩා සමාජ ශාලාවේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පවතින උපකරණවල අයිතම 07 ක ඌනතාවයන් 32 ක් හා එක් අයිතමයක අතිරික්තයන් 13 ක් පැවතුණි. | ගබඩාව නිසි ලෙස නඩත්තු කළ යුතු වීම. | 2020 වර්ෂයේ සිදුකරන ලද සමීක්ෂණයට අනුව ඌනතා හා අතිරික්තතා සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත. |
| (ඉ) | රජයේ සේවකයන්ගේ ක්‍රීඩා සමාජ ශාලාවට යාබදව පවතින කාමර තුන 2018 ජූලි 03 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිවිල් ආරක්ෂක අංශයට නවාතැන් පහසුකම් සඳහා ලබාදී ඇති නමුත්, 2018 දෙසැම්බර් මාසයේ සිට 2020 අප්‍රේල් 30 දින දක්වා මෙම කාමර තුන ඌන උපයෝජිතව පැවතුණි. | ගොඩනැගිල්ල ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීම කළ යුතුවීම. | ක්‍රීඩා සමාජ ශාලාවේ භාරකරු සඳහා පවතින ස්ථානයක් බවත් භාරකරුවෙක් මේ සඳහා පත් කිරීමෙන් පසු පවරා දීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |
| (ඊ) | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කාර්යාල පරිශ්‍රය තුළ ඇති භාණ්ඩ අයිතම 21 ක ඌනතාවයන් 357 ක් හා අයිතම 52 ක අතිරික්තතාවයන් 640 පැවතුණි. | ඌනතා හා අතිරික්තයක් සම්බන්ධව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඌනතා පවතින බවට සඳහන්ව තිබූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩාව පරීක්ෂා කිරීමේදි සහ මීට පෙර සේවය කරන ලද නිලධාරියෙන්ගෙන් විමසීම් කිරීම මගින් සොයා ගැනීමට හැකිවූ බවත්, ඊට අමතරව ගබඩාවේ සුන්බුන් අතර තිබී සමහර භාණ්ඩ හඳුනා ගැනීමට හැකිවූ බවත්, අතිරික්තතා ලෙස දක්වන ලද භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ පවතින වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් භාණ්ඩ බව තහවුරු වූ බවත් දන්වා ඇත. එසේම වර්තමානයේ භාණ්ඩ සඳහා CIGAS අංකයක් ලබා මනාව පවත්වාගෙන යනු ලබන බව දන්වා ඇත. |
| (උ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 2:1 වගන්තිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස නඩත්තු කිරීමේ | නොපමාව අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මගින් ඒවායේ අළුත්වැඩියා කිරීම් කටයුතු මේ වන විට දිස්ත්‍රික් ඉංජිනේරු අධීක්ෂණය |

| | | |
|---|---|---|
| වගකීම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත පැවරුණද, කාර්යාලයට අයත් රජයේ නිවාස 66 කින් දෙකක් අබලන් තත්ත්වයට පත්වී තිබූ අතර, ඒවා නිලධාරීන්ගේ භාවිතය සඳහා ලබාදිය නොහැකිව පැවතුණි. | | යටතේ සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

**3.11 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව අඹගමුව ප්‍රාදේශීය ලේකම්කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු රු.30,000 ක ඇප තැන්පත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතුවීම. | කඩිනමින් ඇප තැන්පත් කිරීමේ කටයුතු සිදුකිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. |

**3.12 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බීජ අර්තාපල් ලබාගැනීම සඳහා රජයේ දායකත්වය වශයෙන්සියයට 50ක් හෙවත් රු.2,375,000 ක ප්‍රතිපාදන 2018 සැප්තැම්බර් 20 දින ලැබී තිබුණි. ව්‍යාපෘති යෝජනාවට අනුව 2018 යල කන්නය සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ අර්තාපල් වගා ගොවීන්ට බීජ අර්තාපල් සඳහා වන පිරිවැය සියයට 50 කින් අඩු කිරීම, දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් අර්තාපල් ආනයනය අවම කර විදේශ විනිමය ඉතිරි කර ගැනීම, ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම, වැලිමඩ අර්තාපල් ගොවීන්ට C I ප්‍රභේදයේ බීජ ලබාදීම ව්‍යාපෘතියේ අරමුණු ලෙසට හඳුනා ගෙන තිබුණි. ව්‍යාපෘති වාර්තාවෙන් අපේක්ෂිත අස්වනු අනුපාතය සාවද්‍ය ලෙස දක්වා | නිලධාරීන් තම රාජකාරිය නිසි ලෙස ඉටු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකිරීම සඳහා අතිරේක දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ඇති අතර එම වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. G 3 ශ්‍රේණියේ අල වෙනුවට C1 හා C11 ගොවින්ට අල ලබාදීම නිසා රු.73,750 ක අධි ගෙවීමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කර තිබුණි. ගොවීන් තම අස්වැන්න බීජ අල සඳහා තබා ගැනීම සියයට 0 ක සිට සියයට 20 ක් දක්වා අඩු පරාසයක විහිද පැවැතුණි. ප්‍රතිලාභ ලැබූ සාමාජිකයන් බහුතරයක් එකම පවුල්වල සාමාජිකයන් වූයෙන් නියැදි පරීක්ෂාවට ලක්වූ ගොවි පිරිස අතරින් ව්‍යාපෘතිය යටතේ සියයට 30 ක ප්‍රතිලාභයන් ඉතා සුළු පිරිසක් අතරේ බෙදී ගොස් තිබුණි. බීජ අල ලබාදීමට ගොවීන් තෝරාගත් පදනමක් නොවූ අතර ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් භූමියක් හා හැකියාවක් පවතින්නේද යන්න පිළිබඳව කිසිදු සහතිකයක් කෘෂිකර්ම නිලධාරියෙකුගෙන් ලබාගෙන නොතිබුණි. | | |
| (ආ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි සහනාධාර ලැබිය යුතු අයගේ පොරොත්තු ලේඛනයේ සහනාධාරලාභින්ගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කර නොතිබුණි. | සහනාධාරලාභීන් ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කළ යුතු වීම. | මේ වන විට හැඳුනුම්පත් අංක ඇතුළත් කර යාවත්කාලීන කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | 2015- 2017 වර්ෂයන්හි සිදුකළ සමීක්ෂණ වාර්තාවල අඩුපාඩු කිසිවක් ප්‍රාදේශීය ලේකම්වරුන් සහභාගී වූ කමිටුවෙන් වාර්තා කර නොතිබියදී, 2019 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද හිමිකම් සහතිකපත් 1515 ක් සංශෝධනය කර තිබුණි. | ප්‍රතිලාභීන් ඇගැයීම් නිර්ණායක හඳුනාගත යුතුවීම. | ආදායම් වැඩිවීම, පදිංචිය හැරයාම, මියයෑම, විදේශගත වීම සහනාධාර ලැබීම සහ වෙනත් කාරණා මත මෙම සංශෝධනයන් සිදුකර ඇති බව දන්වා ඇත. |
| (ඈ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 08ක පොරොත්තු ලේඛනයේ නම සඳහන් නොවූ පුද්ගලයින්ට සමෘද්ධි සහනාධාර ගෙවීම් කර තිබූ අවස්ථා 47 ක් පැවතුණි. | නිලධාරීන් තම රාජකාරිය චක්‍රලේඛ ප්‍රකාරව නිසි ලෙස ඉටු කළ යුතු වීම. | සමෘද්ධි දෙපාර්තමේන්තුවට පොරොත්තු ලේඛනයක් යොමුකර තිබූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද පොරොත්තු ලේඛනයක් පැවති නමුත් එම ලේඛන අතර පරස්පරතාවයන් තිබූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 496 කින් වසම් 68 ක පුද්ගලයන්ගෙන් කිසිවෙකුට නව සමෘද්ධි සහනාධාර ලබාදී නොතිබුණි. එම වසම්වල පොරොත්තු ලේඛනයන්හි පුද්ගලයන් 1,880 ක් ඇතුළත්ව පැවතුණි. | නිලධාරීන් තම රාජකාරිය චක්‍රලේඛ ප්‍රකාරව නිසි ලෙස ඉටු කළ යුතු වීම. | ඉල්ලීම් කරන ලද සියළු ප්‍රතිලාභීන් හට සහනාධාර ලබා දීම් සිදු නොකළ අතර දෙවන වටයේදී එම ප්‍රතිලාභීන්ට සහනාධාර ලබා දෙන බව ප්‍රධාන කාර්යාලයෙන් දැනුම් දී ඇති බව දන්වා ඇත. |
| (ඊ) | දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සහනාධාර පොරොත්තු ලේඛනයේ සඳහන් අනුපිළිවෙලින් බැහැරව ගෙවීම් කර තිබූ අවස්ථා 1,482 ක් පැවතුණි. පොරොත්තු ලේඛනයෙන් බැහැරව ගෙවීම් කිරීම සියයට 1 ක සිට සියයට 100 ක පරාසයක විහිද පැවතුණි. | නිලධාරින් තම රාජකාරිය චක්‍රලේඛ ප්‍රකාරව නිසි ලෙස ඉටු කළ යුතු වීම. | තෝරාගත් සියලු දෙනාහට ගෙවීම් කිරීමක් සිදුකර නොමැති අතර වසම්වල නිලධාරීන් සහිත කමිටුවක් මගින් නිර්දේශ ලබා දී ඇත. එම නිර්දේශ මත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වෙත යොමු කර පසුව එම දෙපාර්තමේන්තුව මගින් එවනු ලැබූ ලේඛනය අනුව ගෙවීම් කර ඇති බව දන්වා ඇත. |
| (උ) | කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් ලෙස ඉදිකර ඇති ලැමසූරිය ඉල්ලගොල්ල අලෙවිසැල් ගොඩනැගිල්ල තුළ විගණිත 2020 මාර්තු 02 දින වන විට සැලූන් ව්‍යාපාරයක් සහ සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යනු ලැබුවද සිල්ලර වෙළඳසැලින් කුලී අයවීමක් නොවූ අතර කුලී ගිවිසුමක්ද නොතිබුණි. | විධිමත් පරිදි කටයුතු කර ගොඩනැගිල්ල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු වන පරිදි උපයෝජනය කළ යුතුවීම. | ලැමසූරිය හප්පාවර (ඉල්ලගොල්ල) සමෘද්ධි අලෙවිසැල් ගොඩනැගිල්ල සම්බන්ධව පත්කළ කමිටු වාර්තාවට අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |
| (ඌ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් නිකුත් කර ඇති උපදෙස් මාලාව අනුව, 2018 වර්ෂය තුළදී කාන්තාවන් 04 දෙනෙකුට පමණක් ණය ලබාදී තිබූ අතර විගණිත දිනය වූ 2019 ඔක්තෝබර් 16 දින වන විට කාර්යාලය වෙත අයදුම්පත් 10 ක් ලැබී තිබුණද, ණය ලබාදී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඉල්ලුම් කර ඇති සියළු දෙනාට ණය ලබාදිම කාර්යක්ෂම කළ යුතුවිම. | 2019 ඔක්තෝම්බර් 26 දින වන විට ලැබී ඇති ණය අයදුම්කාරියන් හට කඩිනමින් චක්‍රීය ණය ලබාදෙන බවත් 2018 වර්ෂයේ 15 දෙනෙකු වෙත චක්‍රීය ණය ලබා දී ඇති බවත් දන්වා ඇත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

### 4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 8 වන ඡේදයේ උපදෙස් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මාණ්ඩලික නිලධාරින් සඳහා නිවාසයක් ඉදිකිරීම පමණක් තම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ව්‍යාපෘතිය ලෙස හඳුනාගෙන තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ඉටු කිරිමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඒ අනුව සකස් කළ ඉලක්ක හා අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් ආයතනයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ඉටු කිරිමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම තුළින් තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණු අතර වර්ෂය තුළ ඉටු කළ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය තිරසර සංවර්ධන ඉලක්ක තුළට ගැලපීම් කර කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් හඳුනාගත යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | දුප්පත්කම තුරන් කිරීමේ අරමුණැති නිශ්චිත ව්‍යාපෘති හඳුනා ගැනීමකින් තොරව ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හා ගම්පෙරලිය සමස්ථ ව්‍යාපෘති 3231 කින්දුප්පත්කම | තිරසර සංවර්ධන අරමුණු නිවැරදිව පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ග්‍රාමීය මාර්ග, පාලම් ඉදිකිරීම, පංසල්, පල්ලි සංවර්ධනය හා ප්‍රජා පාදක සමිති ශක්තිමත් කිරීම තුළින් ග්‍රාමීය වශයෙන් |

| | | | |
|---|---|---|---|
| | තුරන් වන බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. | | යටිතල පහසුකම් සංවර්ධනය වීමෙන් ජනතාවට තම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වඩා පහසුවෙන් ඉටුකර ගත හැකි අතර ඒ තුළින් පවුල වෙත ආදායම් උත්පාදනය වීමෙන් දුගී බවට පිළියම් සපයා ගත හැකි බව දන්වා ඇත. |
| (ඇ) | ජීවත්වීම සඳහා ඉඩම් ලබාදීම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමක් ලෙස දක්වා තිබුණද, නිශ්චිත ඉලක්ක පිහිටුවා ගැනීමක් සිදුකර නොතිබුණි. | නිසි ලෙස ඉලක්ක පිහිටුවා ගත යුතුය. ඒවා මැනිය හැකි විය යුතු වීම. | මෙහිදී ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් බලපත්‍ර ලබා දීම මගින් ඉඩම් බෙදා දීම අදහස් කරනු ලබන අතර එහිදී ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් හදුනාගත් ඉලක්ක සපුරා ඇති ආකාරය අනුව කාර්යසාධනය ඇගයීම සිදුකළ හැකි බව දන්වා ඇත. |
| (ඈ) | බඩගින්නෙන් පෙළෙන අයනැතිකිරීම සඳහා කාන්තාවන් 600 ක් ඉලක්කකර ගනිමින් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා යොමු කිරීමට ඉලක්ක කර තිබූ අතර කාන්තාවන් 52 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | පිහිටුවාගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළඟා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සිදුකර ඇති අතර එහිදී කාන්තාවන් අදාළ වැඩසටහනට කැඳවීම් කළ ද සහභාගී වූ ප්‍රමාණය මත කාන්තාවන් 487 ක් සඳහා වැඩ සටහන ක්‍රියාත්මක කර ඇති බව දන්වා ඇත. |
| (ඉ) | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකබලා ගැනීම හා පුහුණු කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම ඉලක්ක කර තිබුණද, එසේ පුහුණු කරන ගුරුවරුන් සංඛ්‍යාවක් ඉලක්කය තුළ සඳහන් කරනොතිබුණි. | නිසි ලෙස ඉලක්ක පිහිටුවා ගත යුතුවිම හා ඒවා මැනිය හැකි විය යුතුවිම. | මෙය රාජ්‍ය නොවන සංවිධාන ප්‍රතිපාදන මත සිදුකිරීමට ඉලක්ක කරන ලද අතර ඉදිරි වැඩසටහන් සඳහා අදාළ ආයතන වෙතින් මුදල් ප්‍රතිපාදන නොලැබීම මත සිදුකිරීමට නොහැකි වූ අතර එම වැඩසටහන මෙම වර්ෂය තුළ ද රාජ්‍ය නොවන සංවිධාන වල ආධාර මත සිදුකිරීමට ඉලක්ක කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ආර්ථික සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී නව ව්‍යාපෘති 60 ක් ආරම්භ කිරීම, පෙර පැවති ව්‍යාපාර 100 ක් සංවර්ධනය කිරීම, 40 දෙනෙකුට කාර්මික පුහුණුව ලබාදීම, 40 දෙනෙකු සඳහා වෙළඳපොළ සම්බන්ධතා ඇති කරදීමට ඉලක්ක කර තිබුණි. පුහුණු වැඩසටහන් පවත්වා තිබුණද, මෙසේ සංවර්ධනය කළ ව්‍යාපාර පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | නිසි ලෙස ඉලක්ක පිහිටුවා ගත යුතුය. ඒවා මැනිය හැකි විය යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (උ) | 2030 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාවය සම්පූර්ණයෙන් තුරන් කිරීමේ තිරසර සංවර්ධන අරමුණ පෙරදැරිව ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි පළමු අදියර යටතේ 2018 වර්ෂය තුළ සමිති 15 ක් සහ එහි දෙවන අදියර යටතේ 2019 වර්ෂය තුළ සමිති 45 ක් ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළඟා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ග්‍රාමශක්ති සමිති පළමු අදියර යටතේ සමිති 16 ක් සහ දෙවන අදියර යටතේ සමිති 45 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (i) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි වසම්වල සමස්ත ජනගහනයට සාපේක්ෂව සමිති සාමාජිකත්වය සියයට 0.75 ක සිට සියයට 43 ක් දක්වා පරාසයක පවතින සමිති සංඛ්‍යාව 49 ක් වී තිබුණි. ග්‍රාමීය ජනතාව වැඩසටහන කෙරෙහි දක්වන අනුකූලතාවය පහළ මට්ටමක පැවතුණි. | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළඟා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | |
| (ii) | 2018 වර්ෂයේ එක් සමිතියකට රු.500,000 බැගින් සමිති 07 ක් සඳහා ලබාදුන් එකතුව රු.3,500,000 ක ප්‍රතිපාදනය විගණිත දිනය වූ 2020 ජනවාරි 16 දක්වා උපයෝජනය කර නොතිබුණි. | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළඟා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | |
| (iii) | හැකියා වර්ධන අරමුදල (ධාරිතා සංවර්ධනය) සඳහා රු.300,000 ක මුදලක් සමිතියකට වෙන්කර ඇති අතර ග්‍රාම ශක්ති සමිති 2 ක් සඳහා ලබාදී තිබූ එකතුව | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළඟා කර ගත | |

| | | |
|---|---|---|
| | රු.600,000 ක් වූ ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. සමිති 07 ක ප්‍රතිපාදන උපයෝජනය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 1 ක සිට සියයට 22 ක් අතර පරාසයක පැවතුණි. | හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | "ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ ගමන් මග" අත්පොතෙහි දෙවන පරිච්ඡේදය අනුව සමිතියේ විධායක සභාවේ සහායට ස්ථිර කමිටු 07 ක් පිහිටුවා ගතයුතු බව දක්වා තිබුණි. පළමු අදියරේ සමිති 15 අතුරින් සමිති 14 ක තරුණ කවයද, සමිති 10 ක හැකියා වර්ධන හා සන්නිවේදන කමිටුවද පිහිටුවා නොතිබුණි. දෙවන අදියර යටතේ ලියාපදිංචි කරන ලද සමිති 41 ක් අතුරින් සමිති 08 ක හැකියා වර්ධන හා සන්නිවේදන කමිටුවද, සමිති 05 ක තරුණ කවයද පිහිටුවා නොතිබුණි. | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළගා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (v) | ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියරේ සමිති 14 ක් අතුරින් සමිති 05 ක් පර්ෂද පිහිටුවා නොතිබූ අතර, දෙවන අදියරේ සමිති 41 ක් අතරින් සමිති 22 ක් කුඩා කණ්ඩායම් සහ සමිති 30 ක් පර්ෂද පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | පිහිටුවා ගත් ඉලක්ක වසර තුළ සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ළගා කර ගත හැකි ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 5. **යහපාලනය**

**-----------------**

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | **--------------------** | **-------------** | **---------------------------** |
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25(1) වගන්තිය අනුව | නොපමාව කටයුතු අවසන් කළ යුතු වීම. | නිරීක්ෂණ පිළිගන්නා බවත් එමගින් දක්වා ඇති තොරතුරු දැනගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු ඉල්ලීම් වැඩ කරන දින 14 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වුවද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එම නියමයන්ට අනුකූලව ක්‍රියා කර නොමැති අවස්ථා 05 ක් අනාවරණය විය. | | අයිතිවාසිකම් පනතේ 25(1) යටතේ වන ඉල්ලීම් සඳහා පිළිතුරු ලබාදෙන ලෙස නැවත වරක් අදාළ අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇති අතර, වහාම ඒ සඳහා පිළිතුරු යොමු කිරීමට කටයුතු කරනු ලබන බවත් දන්වා ඇත. |
| (ආ) | 2018 මාර්තු 21 දිනැති අංක 02/2018(1)3 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ හි 04 ඡේදය ප්‍රකාරව මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි සඳහා විසඳුම් ලබාදීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් ගොඩනැගීමටත් සහ එම තොරතුරු වාර්තාගත කර මිනුම්කර බැලීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු නමුත්, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි හා පෙත්සම් සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීම සඳහා පැමිණිලි හා පෙත්සම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. ක්‍රියාමාර්ග ගෙන අවසන් පැමිණිලි සම්බන්ධ ප්‍රගති වාර්තාව පමණක් යාවත්කාලීන කර තිබුණි. තවද, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 ජූලි මාසයෙන් පසු ලදපැමිණිලි, ලේඛනයේ සටහන් කර නොතිබූ අතර විවිධ පාර්ශවයන් විසින් ඉදිරිපත් කර තිබූ පැමිණිලි 07ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලේඛනයක් පිළියෙල කළ යුතු වීම. | විගණන විමසුමෙන් අනතුරුව ඒවා ලැබෙන අනුපිළිවෙලින් මහජන පෙත්සම් හා පැමිණිලි ලේඛනයක් සැකසුමට උපදෙස් දුන් බවත්, මේ වන විට පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් දන්වා ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ---------------------------- |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරීයෙකුම සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලැබෙන පරිදි මානව | චක්‍රලේඛ නියමයන්ට අනුව මානව සම්පත් සැලැස්ම පිළියෙළ | මේ වන තුරු සකස් කර ඇති මානව සම්පත් සැලැස්ම වෙනත් ආකෘතියකින් සකස් කර ඇති අතර මෙම වර්ෂයේ |

| | | |
|---|---|---|
| සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා තිබුණද එයින් 07 ක්ම සංවර්ධන නිලධාරීන් ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් වී තිබුණි. | කළ යුතු වීම. | සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ආකෘතිය අනුව මානව සම්පත් සැලැස්ම සකස් කරන බව දන්වා ඇත. කාර්යාල නිලධාරීන්ගේ පුහුණු ලිපිගොනුවේ මෙම කාර්යාලයේ නිලධාරීන් සම්පත් දායකයන් ලෙස යොදාගෙන සිදු කළ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇතුළත් වී නොමැති බවත් දන්වා ඇත. |